# 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ VIII වන කොටසේ 39(4) වගන්තිය යටතේ ප්‍රකාශිත ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන අරමුදල් සමාලෝචන කමිටු වාර්තාව

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

2025 ජූලි 02

## පටුන


1. හැඳින්වීම ........ 1

2. කමිටුවේ කාර්යභාරය ........ 2

3. සමාලෝචන ක්‍රියාවලිය සහ මුහුණ දුන් අභියෝග ........ 3

4. නිර්වචන ........ 4

 4.1 ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ........ 4

 4.2 රජයේ අරමුදල් ........ 4

 4.3 ව්‍යවස්ථාපිත අරමුදල් ........ 4

5. කමිටුවේ සමාලෝචනයට භාජනය වූ අරමුදල් ........ 5

6. සමාලෝචන කමිටුවේ නිර්දේශ ........ 5

 6.1 ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගත යුතු අරමුදල් ........ 6

 6.2 වසා දැමිය යුතු අරමුදල් ........ 15

 6.3 සංවිධාන ව්‍යුහය වෙනස් කළ යුතු අරමුදල් ........ 32

 6.4 රජයේ නොවන අරමුදල් ........ 34

 6.5 නීතිපති විමසා ඉදිරි කටයුතු කළ යුතු අරමුදල් ........ 38

 6.6 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි වසා දැමීමට සුදුසු බවට එකඟ වූ ව්‍යවස්ථාපිත අරමුදල් ........ 43

 6.7 දැනට අරමුදල් ලෙස හඳුනාගෙන ඇති නමුත් තවදුරටත් අරමුදල් කාණ්ඩයට අයත් නොවන ගිණුම් ශේෂ ........ 45

 6.8 වෙනත් නිර්දේශ සහිත අරමුදල් ........ 48

7. පොදු නිරීක්ෂණ හා නිර්දේශ ........ 55

 7.1 පොදු නිරීක්ෂණ ........ 55

 7.2 නිර්දේශ ........ 55

ඇමුණුම්

ඇමුණුම 01 - 2024.11.06 දිනැති හා අංක 04/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ....................................57

ඇමුණුම 02 - ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත්කර ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කිරීමේදී එය සාධාරණීකරණය කරමින් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව. ..................................... 60

ඇමුණුම 03 - භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත්කර තිබූ අරමුදල් සමාලෝචන කමිටුවේ 2017.03.31 වාර්තාවේ සඳහන් කර තිබූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ..................................... 61

ඇමුණුම 04 - භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත්කර තිබූ අරමුදල් සමාලෝචන කමිටුවේ 2017.03.31 දිනැති වාර්තාවේ සඳහන් කර තිබූ රාජ්‍ය නොවන හා ව්‍යවස්ථාපිත නොවන ලෙස වර්ග කර තිබූ අරමුදල් ............................................................................................... 64

ඇමුණුම 05 - අමාත්‍යාංශ විසින් තම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ආයතන යටතේ පවත්වාගෙන යන බවට පසුව වාර්තා කළ හා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ රැස්වීම්වලදී හෙළිදරව් වූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල්.... 69

ඇමුණුම 06 - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි වසා දැමීමට සුදුසු බවට එකඟ වූ ව්‍යවස්ථාපිත අරමුදල් ..................................... 71

ඇමුණුම 07 - ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගත යුතු අරමුදල් ..................................... 72

ඇමුණුම 08 - වසා දැමිය යුතු අරමුදල් ..................................... 74

ඇමුණුම 09 - සංවිධාන ව්‍යුහය වෙනස් කළ යුතු අරමුදල් ..................................... 76

ඇමුණුම 10 - රජයේ නොවන අරමුදල් ..................................... 77

ඇමුණුම 11 - නීතිපති විමසා ඉදිරි කටයුතු සිදු කළ යුතු අරමුදල් ..................................... 78

ඇමුණුම 12 - රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි වසා දැමීමට සුදුසු බවට එකඟ වූ ව්‍යවස්ථාපිත අරමුදල් ..................................... 80

ඇමුණුම 13 - දැනට අරමුදල් ලෙස හඳුනාගෙන ඇති නමුත් තවදුරටත් අරමුදල් කාණ්ඩයට අයත් නොවන ගිණුම් ශේෂ..................................... 81

ඇමුණුම 14 - වෙනත් නිර්දේශ සහිත අරමුදල් ..................................... 82

ඇමුණුම 15 - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ..................................... 84

ඇමුණුම 16 - සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ..................................... 86

භාණ්ඩාගාර ලේකම්,

## අරමුදල් සමාලෝචන කමිටු වාර්තාව

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වන වගන්තිය ප්‍රකාරව යම් නිශ්චිත කාර්යයක් සඳහා නීතියෙන් වෙන් කර නොමැති ජනරජය සතු සියළුම ආදායම් සහ ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුව ඇතත්, බොහෝ රාජ්‍ය ආයතනවල ඉන් පරිබාහිරව ව්‍යවස්ථාපිත හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් පවත්වාගෙන යනු ලබයි. එසේ ඒකාබද්ධ අරමුදලට පරිබාහිරව ක්‍රියාත්මක වන අරමුදල් සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව, 2024.08.08 දින සිට බලාත්මක 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත (Public Financial Management Act) මගින් පැහැදිලිව දක්වා ඇත.

ඒ අනුව, රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත අරමුදල්වල කටයුතු වඩාත් විධිමත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන උක්ත පනතේ VIII වන කොටසේ 39 (1) උප වගන්තිය සිට 39(3) උප වගන්තිය දක්වා වන වගන්ති යටතේ සලසා ඇත. ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව පනතේ VIII වන කොටසේ 39 (4) උප වගන්තිය යටතේ සලසා ඇති අතර එහි මෙසේ සඳහන් වේ.

39 (4) "මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට යම් ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ඒවායේ ක්‍රියාකාරීත්වය අවසන් කළ යුතු අතර, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත එම අරමුදල් විසුරුවා හරිනු ලැබිය යුතු ය:

එසේ වුව ද, එම අරමුදල දිගටම පවත්වාගෙන යා යුතු බවට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විමසා මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබුවහොත් නියම කරනු ලබන පරිදි එම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කරනු ලැබිය හැකිය''

ඒ අනුව, උක්ත පනතේ 39 (4) උප වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2024.11.06 දිනැති හා අංක 04/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ලබා දී ඇත (ඇමුණුම 01). එමගින් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් විසුරුවා හැරීම හෝ ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ද තවදුරටත් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව, දැනට පවතින ව්‍යවස්ථාපිත නොවන අරමුදල්වල මෙහෙයුම් කටයුතු ඉදිරියටත් පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි අදහස් කරන්නේ නම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා අදාළ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කොට ඒ සම්බන්ධයෙන් හේතු නිසි ලෙස සාධාරණීකරණය කරමින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළයුතු වේ. ඒ අනුව, එකී අරමුදල ඉදිරියට පවත්වාගෙන යා යුතු බවට භාණ්ඩාගාර ලේකම්වරයා විමසා මුදල් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබුවහොත් එම අරමුදල ව්‍යවස්ථාපිත තත්ත්වයට පරිවර්තනය කරනු ලැබිය හැක.

ඒ අනුව, රේඛීය අමාත්‍යාංශ වෙතින් ලැබෙන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධ ඉල්ලීම් සමාලෝචනය කර ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට සුදුසු තීරණවලට එළැඹීමට අවශ්‍ය නිර්දේශ ලබාදීමේ දී අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමේ අරමුණින් ඔබගේ අංක PFD/RED/REG/CIR/2024/02 හා 2024.11.21 සහ 2025.01.23 දිනැති ලිපි මගින් පහත සඳහන් කමිටුව පත්කර ඇත.

| | | |
|---|---|---|
| ඒ. කේ. සෙනෙවිරත්න මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් | - | සම සභාපති |
| එච්. සී. ඩී.එල්. සිල්වා මහතා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් | - | සම සභාපති |
| ජී.ඒ.එස්. අතුල කුමාර මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | - | සාමාජික |
| ජූඩ් නිලුක්ෂාන් මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | - | සාමාජික |
| ඩබ්.ඒ. සමන්ත උපනන්ද මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව | - | සාමාජික |
| ඒ.එන්. හපුගල මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | - | සාමාජික |
| ඊ.ඒ. රත්නසීල මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව | - | සාමාජික/ කැඳවුම්කරු/ කමිටු ලේකම් |
| ඒ.කේ.ඩී.ඩී.ඩී. අරන්දර මහතා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නීති කටයුතු දෙපාර්තමේන්තුව | - | සාමාජික |

## 2. කමිටුවේ කාර්යභාරය

2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 මගින් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් විසුරුවා හැරීම හෝ ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පරිවර්තනය කර ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන කටයුතු කළයුතු ආකාරය පිළිබඳව ලබා දී ඇති උපදෙස් අනුව, පවතින ව්‍යවස්ථාපිත නොවන අරමුදල්වල මෙහෙයුම් කටයුතු ඉදිරියටත් පවත්වාගෙන යාමට අවශ්‍ය යැයි හැඟෙන විට රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා අදාළ අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කොට ඒ සම්බන්ධයෙන් හේතු, නිසි ලෙස සාධාරණීකරණය කරමින් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

ඒ අනුව, රේඛීය අමාත්‍යාංශ වෙතින් ලැබෙන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධව එවැනි ඉල්ලීම් සමාලෝචනය කර ඒ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට සුදුසු තීරණවලට එළැඹීමට අවශ්‍ය නිර්දේශ ලබාදීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා වෙත නිර්දේශ ලබා දීම මෙම කමිටුවේ කාර්යභාරය වේ.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39 (4) වගන්තියට අනුව එම පනත ක්‍රියාත්මක වන දින සිට වසරක් ඇතුළත රාජ්‍ය ආයතන යටතේ ඇති ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තිබේ නම්, ඒවායේ කටයුතු අවසන් කළ යුතුව ඇත. ඒ අනුව, සෑම ව්‍යවස්ථාපිත නොවන අරමුදලක්ම 2025.08.07 දිනට පෙර ඒවායේ මෙහෙයුම් කටයුතු අවසන් කිරීම හෝ ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකොට අවසන් කළ යුතුව ඇත. එබැවින්, උක්ත සමාලෝචන ක්‍රියාවලිය සඳහා ලැබී තිබුණේ ඉතා සීමිත කාලයකි.

එබැවින්, උක්ත 04/2024 චක්‍රලේඛ ප්‍රකාරව ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගැනීමට කරන ලද ඉල්ලීම්වලට අමතරව අදාළ ආයතනවල නිලධාරීන් කැඳවා සාකච්ඡා කොට රැස් කරගත් තොරතුරු හා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් ඒ ඒ අමාත්‍යාංශ හා ඒ යටතේ ඇති ආයතන කැඳවා පවත්වන ලද සාකච්ඡාවලදී ඉස්මතු වූ කරුණු ද මෙම සමාලෝචන කටයුතු සඳහා උපයෝගී කර ගැනීමට කටයුතු කරන ලදි.

## 3. සමාලෝචන ක්‍රියාවලිය සහ මුහුණ දුන් අභියෝග

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රජයේ ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් 2024.11.06 දිනැති අංක 04/2024 රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව තොරතුරු වාර්තා කරන ලෙස රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අදාළ ආයතන වෙත අවස්ථා කීපයකදීම දැනුම් දී තිබූ අතර, ඒ සඳහා තොරතුරු ඉදිරිපත් කිරීමට ආකෘතියක්ද (ඇමුණුම 02) හඳුන්වා දී තිබුණි. ඒ අනුව, උක්ත රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව තොරතුරු ඉදිරිපත් කිරීමට ලබා දුන් කාලය 2024.12.31 දිනෙන් අවසන් වූ අතර, නැවතත් එය 2025.01.15 දින දක්වා දීර්ඝ කිරීමක්ද සිදු කර ඇත. එහෙත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ඒ යටතේ ඇති ආයතන විසින් ඉදිරිපත් කර තිබූ ඉල්ලීම් ප්‍රමාණය ඉතා සීමිත ප්‍රමාණයක් විය. එහෙත් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනත ප්‍රකාරව සෑම ව්‍යවස්ථාපිත නොවන අරමුදලක්ම 2025.08.07 දිනට පෙර ඒවායේ මෙහෙයුම් කටයුතු අවසන් කිරීම සහ ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකොට අවසන් කළ යුතුව ඇති බැවින් සමාලෝචන ක්‍රියාවලිය සඳහා ලැබී තිබුණේ ඉතා සීමිත කාලයකි.

ඒ අනුව, එසේ සමාලෝචනයට භාජනය කළ යුතු ව්‍යවස්ථාපිත නොවන අරමුදල් හඳුනා ගැනීම ගැටළු සහගත විය. එහිදී අරමුදල් සමාලෝචනය සම්බන්ධයෙන් 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාවේ සඳහන් ව්‍යවස්ථාපිත නොවන හා රාජ්‍ය නොවන (Non Public) ලෙස වර්ග කර තිබූ අරමුදල් (2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමණාකරණ පනතේ "රජයේ අරමුදල්" යන්න අර්ථ නිරූපණය කර ඇති ආකාරය අනුව "රජයේ නොවන අරමුදල්" ලෙස උක්ත අරමුදල් සමාලෝචන කමිටුව විසින් හඳුනාගෙන තිබූ අරමුදල් ද නැවත සමාලෝචනය කළ යුතු බවට නිරීක්ෂණය විය) සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 පරිදි අමාත්‍යාංශ විසින් තම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ආයතනවලින් ඒවා යටතේ පවත්වාගෙන යන බවට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වාර්තා කර තිබූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ද මෙම සමාලෝචනයට භාජනය විය.

ඒ අනුව, ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවත්වාගෙන යන්නේ ද නැතිනම් ඒවායේ කටයුතු අවසන් කරන්නේ ද යන්න හෝ වෙනත් සුදුසු තීරණ ලබාදීමේදී කමිටුව විසින් අවධානය යොමු කරන ලද කරුණු පහත සඳහන් පරිදි වේ.

- සලකා බලනු ලබන අරමුදල මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය වාර්ෂික අයවැය ක්‍රියාවලිය හරහා ඉටුකල හැකිද යන්න සම්බන්ධයෙන් අදාළ ආයතන මගින් සිදු කරන ලද කරුණු දැක්වීම් සහ පැහැදිලි කිරීම්.
- 2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 අනුව ඒ ඒ අමාත්‍යාංශ විසින් සකස් කොට ඉදිරිපත් කරන ලද තොරතුරු.
- මෙම අරමුදල් සමාලෝචන කමිටුව විසින් අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ආයතනවලින් අදාළ නිලධාරීන් සමාලෝචන කමිටුව ඉදිරියට කැඳවා සිදු කරන ලද සාකච්ඡාවලදී ඉදිරිපත් වූ කරුණු සහ පැහැදිලි කිරීම්.
- 2017/03/31 දිනැති අරමුදල් සමාලෝචන කමිටු වාර්තාවෙහි ඇතුළත් කරුණු, නිර්දේශ, නිරීක්ෂණ සහ ඒ සඳහා ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය. (2017.08.01 දිනැති සහ අංක අමප/17/1615/702/002-XVII)

- ඒ ඒ අමාත්‍යාංශ, ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතනවල අදාළ නිලධාරීන් කැඳවා ඔවුන් සමග මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පවත්වන ලද රැස්වීම්වලදී ඉදිරිපත් වූ කරුණු සහ පැහැදිලි කිරීම්.
- රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අදාල ලිපි ගොනුවල ඇතුළත්ව තිබූ තොරතුරු සහ එක් එක් අරමුදල් සම්බන්ධයෙන් විගණකාධිපතිගේ නිරීක්ෂණ.
- එසේම, රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ පවතින, එහෙත් මේ වනවිට සක්‍රීය ක්‍රියාකාරීත්වයක් නොමැති ව්‍යවස්ථාපිත අරමුදල් වසා දැමීම සඳහා උපදෙස් ඉල්ලා තිබූ බැවින් ඒ පිළිබඳවද මෙම කමිටුවේ අවධානය යොමු කරන ලදී.

# 4. නිර්වචන

## 4.1 ව්‍යවස්ථාපිත නොවන අරමුදල්

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අර්ථ නිරූපණය අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් යන්නෙන් "නීතියක් මගින් පිහිටවනු නොලැබූ අරමුදල්" අදහස් වෙයි. (2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 60 පිටුව.)

## 4.2 රජයේ අරමුදල්

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අර්ථ නිරූපණය අනුව "රජයේ අරමුදල් යන්නෙන් සැකසුරුවම, ඉතිරි කිරීම හෝ සමාජය ගොඩනැගීම ඇතුළු අනුමත අවසන් කිරීමේ අරමුදල් හෝ සේවා නියුක්තයන් විසින් දායක වනු ලබන සුභසාධක අරමුදලක් හෝ, අදාළ ලිඛිත නීතිය යටතේ සේවා නියුක්තයන්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් පාරිතෝෂික අරමුදලක් හෝ හැර ඒකාබද්ධ අරමුදලේ හෝ වෙනත් යම් අරමුදලක හෝ රජයේ පාලනයේ ඇති අරමුදල්" අදහස් වේ. (2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 62 පිටුව.)

## 4.3 ව්‍යවස්ථාපිත අරමුදල්

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අර්ථ නිරූපණය අනුව "රජයේ අරමුදල් යන්නෙන් සකසුරුවම, ඉතිරි කිරීම හෝ සමාජය ගොඩනැගීම ඇතුළු අනුමත අවසන් කිරීමේ අරමුදල් හෝ සේවානියුක්තයන් විසින් දායක වනු ලබන සුභසාධන අරමුදලක් හෝ, අදාළ ලිඛිත නීතිය යටතේ සේවා නියුක්තියන්ගේ සේවය අවසන් කිරීමේ දී පාරිතෝෂික දීමනා ගෙවීමේ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන යම් පාරිතෝෂික අරමුදලක් හැර රාජ්‍ය මුදල් වෙන් කර ඇති ඒකාබද්ධ අරමුදල නොවන පාර්ලිමේන්තුවේ පනතක් මගින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විශේෂ කාර්යයක් සඳහා නිර්මාණය කරන ලද හෝ පිහිටුවන ලද යම් අරමුදලක්" අදහස් වේ. (2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 64 පිටුව.)

## 5. කමිටුවේ සමාලෝචනයට භාජනය වූ අරමුදල්

ඒ අනුව, සමාලෝචනයට භාජනය වූ අරමුදල් පහත පරිදි හඳුනාගත් අරමුදල් වේ.

| අංකය | අරමුදල් හඳුනාගත් මූලාශ්‍රය | අරමුදල් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාවේ සඳහන් කර තිබූ ව්‍යවස්ථාපිත නොවන ලෙස වර්ග කර තිබූ අරමුදල් (ඇමුණුම 03) | 37 |
| 2 | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාවේ සඳහන් කර තිබූ රාජ්‍ය නොවන හා ව්‍යවස්ථාපිත නොවන ලෙස වර්ග කර තිබූ අරමුදල් (ඇමුණුම 04)<br><br>සටහන: භාණ්ඩාගාරයේ ලේකම් විසින් පත්කර තිබූ අරමුදල් සමාලෝචන කමිටුවේ 2017.03.31 දිනැති වාර්තාවේ මෙම අරමුදල් රාජ්‍ය නොවන අරමුදල් ලෙසට හඳුනාගත්ත ද 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන සහ අර්ථ නිරූපණය අනුව මෙම අරමුදල් නැවත සමාලෝචනය කරන ලදී. | 62 |
| 3 | අමාත්‍යාංශ විසින් තම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ යටතේ ඇති ආයතන යටතේ පවත්වාගෙන යන බවට පසුව වාර්තා කළ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පැවති රැස්වීම්වලදී හෙළිදරව් වූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් (ඇමුණුම 05) | 22 |
| 4 | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි වසා දැමීමට සුදුසු බවට එකඟ වූ ව්‍යවස්ථාපිත අරමුදල් (ඇමුණුම 06) | 03 |
| එකතුව | | **124** |

## 6. සමාලෝචන කමිටුවේ නිර්දේශ

ඒ අනුව, සමාලෝචන ක්‍රියාවලියෙන් අනතුරුව සමාලෝචනයට භාජනය කරන ලද සියලුම අරමුදල්, ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගත යුතු අරමුදල්, වසා දැමිය යුතු අරමුදල්, සංවිධාන ව්‍යුහය වෙනස් කළ යුතු අරමුදල්, රජයේ නොවන අරමුදල්, නීතිපති විමසා ඉදිරි කටයුතු කළ යුතු අරමුදල්, දැනට අරමුදල් ලෙස හඳුනාගෙන ඇති නමුත් තවදුරටත් අරමුදල් කාණ්ඩයට අයත් නොවන ගිණුම් ශේෂ සහ වෙනත් නිර්දේශ සහිත අරමුදල් ලෙස හඳුනාගන්නා ලදි. ඒ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| අංකය | විස්තරය | අරමුදල් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | 6.1 ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කරගතයුතු අරමුදල් (ඇමුණුම 07) | 19 |
| 2 | 6.2 වසා දැමිය යුතු අරමුදල් (ඇමුණුම 08) | 23 |
| 3 | 6.3 සංවිධාන ව්‍යුහය වෙනස් කළ යුතු අරමුදල් (ඇමුණුම 09) | 14 |
| 4 | 6.4 රජයේ නොවන අරමුදල් (Non Public Funds) (ඇමුණුම 10) | 06 |
| 5 | 6.5 නීතිපති විමසා ඉදිරි කටයුතු සිදු කළ යුතු අරමුදල් (ඇමුණුම 11) | 27 |
| 6 | 6.6 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි වසා දැමීමට සුදුසු බවට එකඟ වූ ව්‍යවස්ථාපිත අරමුදල් (ඇමුණුම 12) | 03 |
| 7 | 6.7 දැනට අරමුදල් ලෙස හඳුනාගෙන ඇති නමුත් තවදුරටත් අරමුදල් කාණ්ඩයට අයත් නොවන ගිණුම් ශේෂ (ඇමුණුම 13) | 06 |
| 8 | 6.8 වෙනත් නිර්දේශ සහිත අරමුදල් (ඇමුණුම 14) | 26 |
| | එකතුව | **124** |

## 6.1 ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගත යුතු අරමුදල්

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර කෙටියෙන් | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| **1.** ගොවීන්ගේ භාර අරමුදල<br><br>**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය (කෘෂිකර්ම අංශය)**<br><br>• 1994.03.09 දිනැති භාර ඔප්පුව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදල සඳහා 1993.12.15 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.<br>• 2002.04.01 දින එවකට පැවති චක්‍රීය අරමුදල හා කෘෂිකාර්මික භාරකාර අරමුදල, ගොවිභාර අරමුදලට ඒකාබද්ධ කර ඇත.<br>• ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය, ගොවි ජනතාවගේ සුභසාධනය වැඩි දියුණු කිරීම, සුළු | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සාමාලෝචන කමිටු වාර්තාව මගින්:<br>• ගොවිසෙත ලොතරැයියේ විකුණුම් ආදායමෙන් යම් ප්‍රතිශතයක් මෙම අරමුදලට නිදහස් කිරීම නතර කිරීමට යටත්ව අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමටත්;<br>• ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වීමකින් තොරව "බැංකු" යන නාමය භාවිතය සම්බන්ධයෙන් වන නෛතික තත්ත්වය, ඉහළ බැංකු පොලී අනුපාතයක් අයකිරීම සහ අරමුදලේ කාර්යයන් නෛතිකව ස්ථාපිත බැංකුවක් සමඟ ඒකාබද්ධ කිරීමේ හැකියාව යන කරුණු සම්බන්ධයෙන් නැවත අධ්‍යයනය කර අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමටත්;<br>නිර්දේශ කර ඇති අතර එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.<br>• ගොවිභාර අරමුදල ඈවර කිරීම සුදුසු නොවන බවත් එම අරමුදල විධිමත්ව සක්‍රියව ඉදිරියට පවත්වාගෙන යාමට සුදුසු ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලෙසත් ගරු විෂය භාර අමාත්‍යතුමා විසින් | <u>ක්‍රියා කිරීම:</u><br>**1. ලේකම් - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**<br>i) මෙම භාර අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීම.<br><br>ii) එහිදී, 2017 අරමුදල් සමාලෝචන කමිටුවේ නිර්දේශ හා අනුගත වෙමින් සුදුසු සංවිධාන ව්‍යුහයක් ස්ථාපනය කිරීම සහ සුළු ගොවීන් සඳහා වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් සැපයීමට හැකිවන පරිදි ඊට අදාළ කාර්යයන් නිශ්චිතව සඳහන් කරමින් අවශ්‍ය නෛතික |

| | | |
|---|---|---|
| ගොවීන්ට කෙටි කාලීන ණය පහසුකම් සැලසීම, කෘෂිකර්ම යෙදවුම් සම්පාදනය යනාදිය මෙම අරමුදලේ අරමුණු වේ.<br>• ඒ අනුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන හරහා විවිධ සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් "ප්‍රදාන" ලබා දීම, පොලී රහිත ණය අත්තිකාරම් ලබා දීම සහ කෘෂි ශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යාපෘති ණය ලබා දීම හා ගොවි බැංකු සඳහා ප්‍රාග්ධනය ලබා දීම යන කාර්යයන් කරනු ලැබේ.<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ සමුච්චිත ශේෂය රු. මි. 2,171.7 ක් වේ. | උපදෙස් ලබා දුන් බව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ අංක 5/1/1/FTF/ව්‍යවස්ථාපිත අරමුදල් හා 2025.04.20 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.<br>• මෙම අරමුදලට අදාල භාර ඔප්පුවේ එවකට භාරකරුවන් ලෙස අත්සන් යොදා ඇති නිලධාරීන් දැනට මෙම අරමුදලේ කටයුතු නොකරන අතර, ඒ වෙනුවට වෙනත් පුද්ගලයන් භාරකරුවන් ලෙස කටයුතු කරන බව පෙනීයන බැවින් මෙම භාර ඔප්පුවේ වලංගුභාවය සම්බන්ධයෙන් ගැටලු සහගත තත්ත්වයක් පවතී.<br>• අරමුදල මගින් කරනු ලබන කාර්යයන් ඉටු කරනු ලබන වෙනත් රාජ්‍ය ආයතන පවතින බැවින් අරමුදලේ කාර්යයන් නිශ්චිතව හඳුනා ගැනීමේ අවශ්‍යතාවය සහ ඒ අනුව සුළු ගොවීන් සඳහා වඩාත් කාර්යක්ෂම හා ඵලදායි සේවාවන් සැපයීමට හැකිවන පරිදි සුදුසු සංවිධාන ව්‍යුහයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවයක් පැවතීම. | විධිවිධාන නව පනතට ඇතුළත් කිරීම. |
| **2.** **පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපළ සංකීර්ණය කළමනාකරණ භාරය**<br><br>**ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය**<br>• 2010.05.26 දිනැති අමප/10/0958/438/001 අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2010.08.10 දින භාරකාර ඔප්පුවක් මගින් මෙම අරමුදල පිහිටුවා ඇත.<br>• මෙම අරමුදල පිහිටුවීමේ මූලික පරමාර්ථය පාරිභෝගිකයන් සඳහා වෙළඳපොළ පහසුකම් වැඩි දියුණු කිරීම, මාළු අපනයන වෙළඳපළ ඉහළ නැංවීම, දේශීය වෙළඳපළ සඳහා ඉහළ | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාවේ පහත සඳහන් නිරීක්ෂණ හා නිර්දේශය ඉදිරිපත් කර ඇත.<br>• විශාල වැය බරක් දරමින් රජය විසින් මෙම වෙළඳපොළ සංකීර්ණය පිහිටුවා ඇති බැවින්, කාර්යක්ෂම කළමනාකාරිත්වයක් ඇති කිරීම සඳහා සුදුසු ශක්තිමත් කළමනාකරණ ක්‍රමවේදයක් සකස් කර අරමුදල තවදුරටත් පවත්වා ගැනීම.<br>• ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ ලේකම් විසින් මූලිකත්වය දරන භාරකාර මණ්ඩලයක් මගින් පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳපළ සංකීර්ණය කළමනාකරණ භාරයේ පරිපාලන කටයුතු සිදු කෙරේ.<br>• ආයතනයේ පවතින පරිපාලනමය කළමනාකරණ ගැටලු හේතුවෙන් ආදායම ඉක්මවා ගිය වියදමක් සිදුවී ඇත. එබැවින්, අරමුදලේ අරමුණු ඉටුකර ගැනීමටත්, එමගින් | **<u>ක්‍රියා කිරීම:</u>**<br>**1.** **ලේකම් - ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය**<br><br>අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කිරීමේ දී පාරිභෝගිකයන්ට සහ ව්‍යවසායකයන්ට වඩා ඵලදායි හා කාර්යක්ෂම ලෙස සේවාවක් සැපයීම සඳහාත්, අනාගතයේදී මෙම අරමුදල රජයට වැය බරක් වීම වලක්වා ගැනීම සඳහාත්, නිසි කළමනාකාරීත්වයක් ඇති කිරීම සඳහාත් තෝරාගත යුතු ව්‍යාපාරික ආකෘතිය (Business Model) කුමක් ද යන්න අදාළ පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබාගෙන හඳුනා ගැනීම හා |

| | | |
|---|---|---|
| ගුණාත්මකභාවයෙන් යුතු මාළු සැපයීම ආදිය වේ.<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.1,891 කි. | පාරිභෝගිකයාට සහ ව්‍යවසායකයාට ප්‍රශස්ත සේවාවක් සැලසීමටත්, වඩා කාර්යක්ෂම කළමනාකාරීත්වයක් ඇති කිරීම සඳහාත් අනාගතයේදී මෙම අරමුදල රජයට වැය බරක් වීම වලක්වා ගැනීම සඳහාත් මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කිරීමේ දී යෝග්‍ය ව්‍යාපාරික ආකෘතිය (Business Model) තෝරාගත යුතු වේ. | එකී ක්‍රමවේදය නව පනතට ඇතුළත් කිරීම. |
| **3. ස්වයං රක්ෂිත සංචිත අරමුදල**<br>බලශක්ති අමාත්‍යාංශය<br>• අංක 02/241 හා 2023.12.06 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ස්වයං රක්ෂිත අරමුදල පිහිටුවා ඇත. | • මෙම ආයතනය සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද පුද්ගලික සමාගමක් වන අතර මෙම අරමුදල අවදානම් කළමණාකරණය කිරීම සඳහා සිදු කරනු ලබන සංචිත වෙන් කිරීමකි.<br>• මූලික ආයෝජනයන් ලෙස රු. බිලියන 1ක භාණ්ඩාගාර බිල්පත් සහ රු. බිලියන 2.5ක සංචිතයක් මගින් ස්වයං රක්ෂිත අරමුදල 2023 වසරේදී ආරම්භ කර ඇත.<br>• වාර්ෂිකව ලාභයෙන් 1% ප්‍රමාණයක් මෙම සංචිතය සඳහා වෙන් කෙරේ.<br>• අදාල ආයෝජනවල පොලිය ද මෙම අරමුදලටම බැර කිරීම සිදු වේ.<br>• දැනට ආයතනය සතු වටිනාකම රු. බිලියන 25 ට අඩු වත්කම් බාහිර රක්ෂණ ආයතනවල රක්ෂණය කිරීම සිදු නොකරන අතර, එම වත්කම් මෙම අරමුදල මඟින් ආවරණය කෙරේ.<br>• මෙය රක්ෂණය සඳහා වන සංචිත අරමුදලක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම ගැටලු සහගත නොවුව ද, ප්‍රතිරක්ෂණය හෝ තිබෙන මුදල් ප්‍රමාණය අනුව යම් අවධානමකදී එය යථා තත්ත්වයට පත් කිරීම මෙම සංචිතය මගින් සිදුකළ හැකි ද යන්න පිළිබඳව අවධානය යොමු කළ යුතුය. | <u>**ක්‍රියා කිරීම**</u><br>**1. ලේකම්, බලශක්ති අමාත්‍යාංශය**<br><br>මෙය අවදානම් කළමනාකරණය සඳහා පවත්වාගෙන යන සංචිත අරමුදලක් බැවින්, ඒ සඳහා නෛතික වලංගුතාවයක් ලබාදීම සඳහාත්, අරමුදලේ අරමුණු, බලතල, කාර්යයන්, වගකීම් නිරවුල් කිරීම හා පාලන ව්‍යුහය නිශ්චිත කිරීම ආදී අරමුදල පරිපාලනය සඳහා අවශ්‍ය වන්නා වූ සියලුම විධිවිධාන ඇතුළත් කොට විශේෂ පනතක් මඟින් මෙම අරමුදල ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කිරීම. |
| **4. ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල**<br>විෂයභාර අමාත්‍යාංශයකට මෙතෙක් පවරා නොමැත.<br><br>• 1990 දශකයේ අග භාගයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාවේ පහත සඳහන් නිරීක්ෂණ හා නිර්දේශය ඉදිරිපත් කර ඇත<br>• සාම්ප්‍රදායික මූල්‍ය ආයතනවලින් නොලැබෙන සේවාවක් මෙම අරමුදල මඟින් සපයන නිසා සහ සිය සේවාවන් සැපයීමෙන් සහ ආයෝජන සිදු කිරීමෙන් රැස්කරගත් තමන්ගේම ඉපැයීම් | <u>**ක්‍රියා කිරීම**</u><br>1. ප්‍රධාන විධායක නිලධාරි, ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල<br><br>මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කිරීමේ කටයුතු කඩිනමින් ඉටු කිරීම. |

| | | |
|---|---|---|
| නියැලෙන අයට මූල්‍ය පහසුකම් සැලසීම සඳහා පිහිටවන ලද මෙම අරමුදල 1998 පාර්ලිමේන්තු අයවැය යෝජනා අනුව ලියාපදිංචි කර ඇති අතර 2005.08.24 දින සංස්ථාගත කර ඇත.<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.1,129.6කි. | සමඟ ක්‍රියාත්මක වන බැවින් මෙම අරමුදල දිගටම පවත්වාගෙන යාමට කමිටුව නිර්දේශ කරයි.<br><br>මෙම අරමුදල සම්බන්ධයෙන් මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී 2025.03.14 දින පැවති සාකච්ඡාවේදී අවධානය යොමු කරන ලද කරුණු<br>• මෙම අරමුදල විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලෙන සුළු හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ට ඇපකර නොමැතිව බැඳුම්කර නිකුත් කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. මේ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 55 ක ප්‍රදානයක් ආරම්භයේදී ලබාදී ඇත.<br>• මෙම අරමුදලේ ලැබීම් මූලාශ්‍ර වනුයේ ඇපකර සඳහා අයකරන ගාස්තු සහ ඉතිරි කිරීම් මත ලැබෙන පොළී මුදල් වේ.<br>• මෙම අරමුදල කුමන අමාත්‍යාංශයක් යටතේ ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳව ගැසට් පත්‍රයේ සඳහන් නොවන බැවින්, එය නිශ්චිතවම අයත් වන අමාත්‍යාංශය කුමක්ද යන්න විමසා ජනාධිපති ලේකම් වෙත ලිපියක් යොමුකර ඇති බව ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරි විසින් දන්වන ලදී.<br><br>2025.05.20 දින මුදල් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී පැවති අරමුදල් සමාලෝචන කමිටුවේ සාකච්ඡා වූ කරුණු:<br>• මෙම අරමුදල පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ඉදි කිරීම් ආරක්ෂණ අරමුදලේ නිලධාරීන් විසින් පැහැදිලි කරන ලදී. එහෙත්, මෙම අරමුදල මඟින් ලබාදෙන ඇපකර සම්බන්ධයෙන් ඇති විය හැකි අවධානම හා වගකීම් සම්බන්ධයෙන් කඩිනම් අවධානය යොමු විය යුතු බවත්, එබැවින් මෙම අරමුදලේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක ඇතුළත් පනතක් මඟින් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත්කර ගත යුතු බව භාණ්ඩාගාරයේ නිලධාරීන් විසින් දැනුවත් කරන ලදී. | එම ක්‍රියාවලියේදී අදාළ සියලුම පාර්ශවයන් සමඟ වැඩිදුරටත් සාකච්ඡා කොට අරමුදලේ කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්ණායක හා කටයුතු විධිමත් කරගැනීමට අවශ්‍ය විධිවිධාන හා ඇතිවිය හැකි අවධානම හා වගකීම් සම්බන්ධයෙන් අවශ්‍ය නිර්ණායක පනතට ඇතුළත් කිරීමටත් කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| 5. ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල<br><br>ජාතික චිත්‍රපට සංස්ථාව<br><br>බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.<br><br>• 1993.12.27 වන දින නිකුත් කරන ලද අංක 1/799 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පිහිටුවා ඇත.<br>• අරමුදල සතු ආයෝජන වටිනාකම 2024.12.31 දිනට රු. මි. 145.4 කි. | ජාතික චිත්‍රපට සංස්ථාවේ නිලධාරීන් 2025.05.20 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදි පැවති රැස්වීමේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදි.<br>• දේශීය චිත්‍රපට කර්මාන්තය සඳහා අවශ්‍ය උපකරණ හා අමු ද්‍රව්‍ය සැපයීම, චිත්‍රපට දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම සඳහා උරදීම සහ ආධාර අනුබල දීම, අරමුදලේ ප්‍රධාන කාර්යයන් වේ.<br>• සංස්ථා භාරයෙන් සංස්ථාවට ලැබෙන අදායමෙන් 20% ක්, ආයෝජන පොලි, චිත්‍රපට නිෂ්පාදනයේදි හා සිනමා ශාලා නවීකරණය සඳහා ලබාදෙන ණය පොලිය, අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගයන් වේ.<br>• චිත්‍රපට සංස්ථාවේ නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව අරමුදල සම්බන්ධයෙන් පහත සඳහන් විකල්ප අතරින් වඩාත් සුදුසු විකල්පය තෝරාගත යුතු වේ.<br>1. විකල්පය<br>• වස්ථාපිත අරමුදලක් වන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ චිත්‍රපටි සංස්ථා භාරය යන අරමුදලට මෙම අරමුදලේ ශේෂය මාරු කොට එම අරමුදල යටතේ මෙම කාර්යයන් සිදු කිරීමේ හැකියාව පරීක්ෂා කර ඒ අනුව කටයුතු කිරීම<br>2. විකල්පය<br>• මෙම අරමුදල වෙනමම ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත්කර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා මෙම ආයතනය ස්ථාපනය කිරීමට පාදක වූ 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම. | ක්‍රියා කිරීම<br>1. ලේකම්, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>2. සභාපති - ජාතික චිත්‍රපට සංස්ථාව<br><br>i.) නිරීක්ෂණ යටතේ සඳහන් පළමු විකල්පය ක්‍රියාත්මක කිරීම.<br><br>ii.) හෝ දෙවන විකල්පය තෝරා ගන්නේ නම්, ඒ සඳහා දැනට 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කරමින් පවතින බැවින් මෙම අරමුදල ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන එම පනතට ඇතුළත් කර ගැනීමට කටයුතු කිරීම. |
| 6. ශ්‍රී ලංකා නාවික හමුදා සුභසාධක අරමුදල<br><br>ශ්‍රී ලංකා නාවික හමුදාව<br>ආරක්ෂක අමාත්‍යාංශය | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, මෙම අරමුදල රාජ්‍ය නොවන අරමුදලක් (Non Public Fund) ලෙස හඳුනාගෙන ඇත.<br><br>එහෙත් මෙම අරමුදල සම්බන්ධයෙන් 2025.01.31 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදි පැවති රැස්වීමේදී විෂය භාර අමාත්‍යාංශ නිලධාරීන් පහත් සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත. | ක්‍රියා කිරීම:<br>1. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය<br>2. නාවික හමුදාධිපති, ශ්‍රී ලංකා නාවික හමුදාව<br>3. ගුවන් හමුදාධිපති , ශ්‍රී ලංකා ගුවන් හමුදාව<br>4. යුධ හමුදාධිපති , ශ්‍රී ලංකා යුධ හමුදාව |

| | | |
|---|---|---|
| | • නාවික හමුදා සේවයේ යෙදී සිටින, විශ්‍රාමික , මියගිය, අතුරුදහන්, ආබාධිත නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධන කටයුතු සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.<br>• මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍ර වනුයේ නාවික හමුදා නිලධාරීන්ගේ දායකත්ව මුදල්, නාවික ඉන්ධන පිරවුම්හලේ ලාභාංශ, නිවාඩු නිකේතන /භෝජනාගාර /උත්සව ශාලාවල ලාභාංශ සහ නාවික පුද්ගලයින්ට සහනදායී පොළී අනුපාතිකයක් යටතේ ලබාදෙන ණය සඳහා අයකරන පොළී ආදායම වේ.<br>• ඒ අනුව, මෙම අරමුදල සඳහා ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ආදායම් වන නාවික ඉන්ධන පිරවුම්හලේ ලාභාංශ සහ නිවාඩු නිකේතන /භෝජනාගාර/ උත්සව ශාලාවල ලාභාංශ ද බැර කරන බැවින් ,මෙම අරමුදල සුභසාධක අරමුදලක් නොවන බව නිරීක්ෂණය වේ.<br>• නාවික ඉන්ධන පිරවුම්හල, නිවාඩු නිකේතන/ භෝජනාගාර /උත්සව ශාලා ඉදිකිරීම සඳහා රජය විසින් යම් ප්‍රාග්ධනයක් වැයකර ඇති බැවින්, නාවික ඉන්ධන පිරවුම්හලෙන් උපයන ආදායමෙන් සහ නිවාඩු නිකේතන /භෝජනාගාර /උත්සව ශාලාවලින් උපයන ආදායමෙන් යම් ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සිදුකළ යුතුවේ.<br>• තවද, මෙම අරමුදල ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වේ. | 5. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව<br><br>i) රජයේ මානව හා භෞතික සම්පත් උපයෝජනයෙන් ලබන ඉපයීම්වල සම්පූර්ණ ආදායම හෝ ආදායම්වලින් යම් ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු කිරීම හා ආරක්ෂක අමාත්‍යාංශය විසින් එම කටයුතු නියාමනය කිරීම.<br><br>ii) ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් දැනට පවත්වාගෙන යනු ලබන සියළුම ව්‍යවස්ථාපිත නොවන අරමුදල් හඳුනා ගැනීම සහ එම අරමුදල් පහත පරිදි කාණ්ඩගත කිරීම.<br><br>I. සුභසාධන කටයුතු වෙනුවෙන් නිලධාරීන්ගේ වැටුපෙන් අවකරණය කරන දායක මුදලින් පමණක් ගොඩනැගී ඇති සුභසාධන අරමුදල්<br><br>II. වසා දැමීමට හැකි අරමුදල්<br><br>III. තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යා යුතු බවට තීරණය කරනු ලබන අරමුදල් අතරින් ඒකාබද්ධ කළ හැකි අරමුදල් |
| 7. ශ්‍රී ලංකා නාවික හමුදා සේවා වනිතා ඒකක අරමුදල<br><br>ශ්‍රී ලංකා නාවික හමුදාව<br>ආරක්ෂක අමාත්‍යාංශය | මෙම අරමුදල සම්බන්ධයෙන් 2025.01.31 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී විෂය භාර අමාත්‍යාංශ නිලධාරීන් පහත පරිදි කරුණු ඉදිරිපත් කර ඇත.<br>• මෙම ආයතනය 1987 අංක 10 දරන ශ්‍රී ලංකා සේවා වනිතා ව්‍යාපාරය සංස්ථාගත කිරීමේ පනත යටතේ ස්ථාපිත කර ඇති බවත් ,මෙහි කාර්යමණ්ඩලය නාවික හමුදා කාර්ය මණ්ඩලය වන අතර, ඔවුන්ට ඒකාබද්ධ අරමුදලෙන් වැටුප් ගෙවන බවත් සඳහන් කරන ලදී. | |

| | | |
|---|---|---|
| | • නාවික හමුදා කාන්තා නිලධාරින්, නාවිකයින් සහ සේවයේ නියුතු නාවික හමුදා පුද්ගලයින්ගේ සුභසාධනය උදෙසා මෙම අරමුදල ස්ථාපිත කර ඇත.<br><br>• මෙම ආයතනයේ ප්‍රධාන ආදායම් මූලාශ්‍ර ලෙස සේවා වනිතා නිවාඩු නිකේතන, සුභසාධන වෑන් රථ සේවාව, සේවා වනිතා සුභසාධක වෙළඳසැල් හා සේවා වනිතා සුභසාධක ව්‍යාපෘතින් මගින් උපයන ආදායම් වේ.<br><br>• ඒ අනුව, මෙම ආයතනය100% ක් රජය සතු ආයතනයක් බවත්, අරමුදලක් නොවන බවත් පැහැදිලි වේ.<br><br>• මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශන රජයේ විගණනයට ඉදිරිපත් කල යුතුවේ.<br><br>• තවද, මෙම ආයතනය විසින් සේවා වනිතා නිවාඩු නිකේතන ,ශ්‍රී ලංකා නාවික නෞකා ගැමුණු - සිඳුලිය සෙවන ,ශ්‍රී ලංකා නාවික නෞකා විජයබා - නිලාවේලි, දියතලාව - අද්මිරාල් කොටේජ් සහ නාවික නිවාඩු නිකේතන මගින් ආදායම උපයන බවත්, එකී නිවාඩු නිකේතන රජයේ වත්කම් වන බැවින්, එම ආදායමින් යම් ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීම සුදුසු වේ. | IV. වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යා යුතු බවට හඳුනා ගනු ලැබූ ව්‍යවස්ථාපිත නොවන අරමුදල්<br><br>iii.) උක්ත III හා IV යටතේ කාණ්ඩ ගත කරන ලද අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය බැවින්, ඒ සඳහා 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ සහ 2024.11.06 දිනැති හා අංක 04/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කර ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම යටතේ, ත්‍රිවිධ හමුදාවට සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සියළුම ආයතනවලට බල පැවැත්වෙන තනි පනතක් හඳුන්වා දීම.<br><br>iv.) ඒ සඳහා දැනට නාවික හමුදාව විසින් සිය ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කිරීමේ අරමුණින් කෙටුම්පත් කරමින් පවතින පනත යොදා ගනිමින් ආරක්ෂක අමාත්‍යාංශයේ මැදිහත් වීම යටතේ එම කෙටුම්පත් පනතට අවශ්‍ය පරිදි නෛතික විධිවිධාන ඇතුළත් කිරීම.<br>v.) වසා දැමීමට හැකි අරමුදල් |
| **8.** ආරක්ෂක අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති ආයතනවල පවතින අනෙකුත් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් (වාර්තා වී ඇති අරමුදල් සංඛාව **12**කි) | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන පහත සඳහන් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් රාජ්‍ය නොවන අරමුදල් (Non Public Fund) ලෙස හඳුනාගෙන ඇත. (අරමුදල් සංඛ්‍යාව 12කි)<br><br>1 Army Benevolent Fund<br>2 Sri Lanka Army Suwasahana Fund<br>3 Sri Lanka Army Welfare Society Fund<br>4 Army Sports Control Board<br>5 Army Religious Fund | |

| | | |
|---|---|---|
| | 6 Sri Lanka Navy Sports Board Fund<br>7 Sri Lanka Navy Agriculture Fund<br>8 Command Welfare Fund - Sri Lanka Air Force<br>9 Command Benevolent Fund - Sri Lanka Air Force<br>10 Central Welfare & Rehabilitation Fund - Sri Lanka Air Force<br>11 Volunteer Air Force Benevolent Fund<br>12 Ranaviru Welfare Fund - Sri Lanka Air Force<br><br>• මෙම අරමුදල් සම්බන්ධයෙන් 2025.01.31 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී විෂය භාර අමාත්‍යාංශ නිලධාරීන් ඉහත සඳහන් අරමුදල් සුභසාධක අරමුදල් ලෙස පවත්වාගෙන යන බවට කරුණු ඉදිරිපත් කර ඇත.<br>• එහෙත්, මෙම අරමුදල් හා සම්බන්ධ කාර්ය මණ්ඩලයට ඒකාබද්ධ අරමුදලින් වැටුප් ගෙවීම, රජය සතු වත්කම් භාවිතා කිරීම, සමහර අරමුදල් සඳහා කාර්යමණ්ඩලය තම වැටුපෙන් දායකත්වය සපයා ඇති බව හා ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ආදායම් ද උක්ත අරමුදල්වලට බැර වී තිබීම යන කරුණු නිරීක්ෂණය විය.<br>• සුභසාධන කටයුතු වෙනුවෙන් නිලධාරීන්ගේ වැටුපෙන් අය කරන දායකත්වයෙන් ගොඩනගා ඇති සුභසාධන අරමුදල් තවදුරටත් ක්‍රියාත්මක කළ හැකි අතර, එම අරමුදල් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක් කිරීමට අවශ්‍ය නොවේ .<br><br>2025.05.20 දින පැවති අරමුදල් සමාලෝචන කමිටු රැස්වීමේදී ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන උක්ත සියළුම අරමුදල් සම්බන්ධයෙන් ත්‍රිවිධ හමුදාව නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදි.<br>• ත්‍රිවිධ හමුදාව යටතේ ක්‍රියාත්මක වන විවිධ උප ඒකකවල සුභසාධක අරමුදල් වෙන් වෙන් වශයෙන් පවත්වාගෙන යන බවත්, එමගින් | නොපමාව වසා දැමීමට කටයුතු කිරීම.<br>vi.) ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත මාසිකව වාර්තා කිරීම. |

| | | |
|---|---|---|
| | නිලධාරීන්ගේ සුභසාධනය අරමුණු කොට ඇති බවත්,<br><br>• 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධාන ප්‍රකාරව ත්‍රිවිධ හමුදාව තුළ පවත්වාගෙන යනු ලබන එවැනි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් මේ වන විට කාණ්ඩ ගත කරමින් පවතින බවත්,<br><br>• තවද, ආරක්ෂක අමාත්‍යාංශය කැඳවමින් 2025.01.31 දින පැවති සාකච්ඡාවේදි ලබාදුන් උපදෙස් ප්‍රකාරව, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ විධිවිධානයන්ට අනුගත වෙමින් ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ පවතින ව්‍යවස්ථාපිත නොවන අරමුදල්, ව්‍යවස්ථාපිත තත්ත්වයට පත්කර ගැනීමේ අරමුණින් මේ වන විට පනතක් කෙටුම්පත් කරමින් පවතින බව,<br><br>• උක්ත නිලධාරීන්ගේ පැහැදිලි කිරීම් අනුව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන ත්‍රිවිධ හමුදාව සහ අනෙකුත් ආයතන විසින් පවත්වාගෙන යනු ලබන, අරමුදල් බොහොමයක් නිලධාරීන්ගේ සුභසාධනය අරමුණු කොට ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ලෙස පවත්වාගෙන යන අරමුදල් බවත්, එම අරමුදල් සඳහා නිලධාරීන්ගේ මාසික වැටුපෙන් දායකත්වය සපයා ඇති බවත් නිරීක්ෂණය වන නමුදු, ත්‍රිවිධ හමුදාවේ සමහර අරමුදල් සඳහා නිලධාරීන්ගේ වැටුපෙන් අවකරණය වන දායක මුදලට අමතරව ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ව්‍යාපෘති ආදායම් ද බැර වන බව නිරීක්ෂණය වේ. | |

## 6.2 වසා දැමිය යුතු අරමුදල්

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර කෙටියෙන් | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| 1. වාහන වායු විමෝචන භාරකාර අරමුදල<br><br>මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව<br><br>ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br><br>• 2008.09.03 දිනැති හා අංක CP/08/1514/358/05 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පිහිටුවා ඇති මෙම අරමුදල භාර ඔප්පුවක් යටතේ භාරකාර මණ්ඩලයක් මගින් ක්‍රියාත්මක වේ.<br>• වාහන වායු විමෝචන පරීක්ෂාවේදී අදාළ සමාගම් විසින් වාහන හිමිකරුවන්ගෙන් අයකරනු ලබන ගාස්තුවට 10%කට සමාන අමතර මුදලක් අයකොට මෙම අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලබයි.<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.983 කි. | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාවේ මෙම අරමුදල වසා දැමිය යුතු බවට නිර්දේශ කර ඇත.<br>• එම කමිටුව ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අංක අමප/17/1615/702/002-xvii හා 2017.08.01 දිනැතිව අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.<br><br>අදාළ අමාත්‍යාංශයේ සහ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීම්වලදී හෙළිදරව් වූ කරුණු:<br>• මෙම අරමුදලේ කාර්යයන් සිදු කිරීම සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කළ හැකි වීම.<br>• අරමුදල මගින් ඉටු කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාල ආයතන සම්බන්ධීකරණය කිරීමේ යාන්ත්‍රණය ලෙස අමාත්‍ය මණ්ඩලය මගින් පත්කරන ලද මෙහෙයුම් කමිටුවක් (Cabinet appointed Steering Committee) හරහා සිදු කිරීම.<br><br>• එම විකල්ප යාන්ත්‍රණය හඳුන්වා දීම හරහා මෙම අරමුදලේ මෙහෙයුම් කටයුතු අවසන් කර අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අංශයක් ස්ථාපිත කිරීම.<br>• මෙම යාන්ත්‍රණය සම්බන්ධයෙන් ජාතික මෙහෙයුම් මැදිරියේ (NOR) නිර්දේශ, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කිරීමට කටයුතු කළ හැකිය.<br>• ඉහත සඳහන් කරුණු ජාතික මෙහෙයුම් මැදිරිය විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කොට අදාළ | ක්‍රියා කිරීම<br>1. ලේකම්, ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය<br>i) අරමුදල වසාදැමීමේ කටයුතු සිදු කිරීම.<br>ii) අරමුදලෙන් සිදු කරන ලද කාර්යයන් සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන සලසා ගැනීම.<br>iii) මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව තුළ වෙනම ඒකකයක් ස්ථාපනය කිරීම.<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික මෙහෙයුම් මැදිරිය/ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව<br>i.) මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය සඳහා අමාත්‍ය මණ්ඩලය මගින් පත් කිරීමට යෝජිත මෙහෙයුම් කමිටුව (Cabinet Appointed Steering Committee) ඇතුළුව අනෙකුත් කරුණු සඳහා අනුමැතිය ලබා ගැනීම |

| | | |
|---|---|---|
| | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.<br>• මෙම අරමුදල වසා දැමීමට කටයුතු කරන ලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා දී තිබුණ ද, මෙතෙක් එසේ නොකිරීම පිළිබඳව නිරන්තරයෙන් විගණන විමසුම් යොමු වීම. | සඳහා ජාතික මෙහෙයුම් මැදිරිය විසින් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිත වාර්තාවට එම කරුණු ද ඇතුළත් කර ඉදිරිපත් කිරීම.<br><br>ii.) 2025.03.25 දින පැවති රාජ්‍ය ආයෝජන අධීක්ෂණ හා ඇගයීම් කමිටුව විසින් මෙම අරමුදල සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ කෙරෙහි ද අවධානය යොමු කොට කටයුතු කිරීම. |
| 2. සමූපකාර චක්‍රීය අරමුදල සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව<br>වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය -<br><br>• 2010.03.11 දින භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් ජීවන වියදම් අඩු කිරිම සම්බන්ධව ක්‍රියාකිරීමට පවත්වන ලද කමිටු රැස්වීමේදී එකඟ වූ පරිදි 2010 වර්ෂයේ රු.මි. 450ක් හා 2011 වර්ෂයේ රු.මි. 450ක් බැගින් වැය විෂය අංක 2502 යටතේ රජයේ අයවැය මඟින් ප්‍රතිපාදන ලබා දී ඇත.<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු. මි.726.97 ක් වේ. | • දැනට මෙම අරමුදලේ ක්‍රියාකාරිත්වයක් නොමැත.<br>• 2024.12.25 දිනට රු.මි. 726.97 ක ආයෝජන පවතින අතර, අරමුදල මඟින් ලබා දී ඇති ණය සඳහා අයවිය යුතු වටිනාකම රු.මි. 287.5කි. එදිනට අයවිය යුතු පොළී මුදල රු. මි. 3.6 ක් වේ. | <u>ක්‍රියා කිරීම:</u><br>**ලේකම්, වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය**<br><br>i.) සමූපාකාර චක්‍රීය අරමුදලේ ණය ශේෂ, හිඟ ණය ශේෂ, හිඟ ණය පොළී හා පොළී අයකර ගැනීමට ක්‍රමවේදයක් සකස්කර ක්‍රියාත්මක කිරීම.<br><br>ii.) චක්‍රීය අරමුදලේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කොට, අරමුදල වසා දැමීම. |

| | | |
|---|---|---|
| 3. සඳහිරුසැය පුණ්‍ය භාරය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>• අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 21/1730/303/143 වූ "සඳහිරුසැය ස්ථූපයේ නඩත්තු කටයුතු සහ පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා භාරකාර මණ්ඩලයක් පිහිටුවීම" යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා සහ ආරක්ෂක ඇමතිතුමා ඉදිරිපත් කළ 2021.09.17 දිනැති සංදේශය සඳහා 2021.09.27 දින එළඹි අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2022.02.02 දිනැති අංක 144 දරන භාර ඔප්පුව මඟින් සඳහිරුසැය ස්ථූපයේ ඉදිරි නඩත්තු කටයුතු හා පරිපාලන කටයුතු නිසි පරිදි සිදු කරගෙන යාම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 471.67 ක් වේ. | • ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ වැටුපෙන් මාසිකව අයකරනු ලබන රු.10.00 බැගින් වන දායක මුදල හා දේශීය විදේශීය බැතිමතුන්ගෙන් ලැබෙන අධාර මෙම අරමුදලේ ලැබීම් මූලාශ්‍ර වේ.<br><br>• මෙම චෛත්‍යයේ ඉදිරි පරිපාලන හා නඩත්තු කටයුතු ක්‍රමවත්ව සිදු කරගෙන යාම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.<br><br>• 2025.01.27 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පැවති සමාලෝචන කමිටු රැස්වීමේ දී බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් මෙම අරමුදල් පිළිබඳව සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ එකී තීරණය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත දන්වා එවිය යුතු බව තීරණය විය.<br><br>ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අංක එම්ඕඩී/දීසවාපිය/3/1 හා 2025.03.11 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.03.05 දින ආරක්ෂක අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේ පහත සඳහන් තීරණ ගෙන ඇත.<br><br>• සඳහිරුසැය චෛත්‍ය ඉදිකිරීමට අදාළව ආරම්භ කරන ලද මෙම භාරය නියමිත නෛතික විධිවිධාන අනුව අවලංගු කර බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් හා නීතිරීතීන්ට අනුකූලව මෙම අරමුදල ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ඉවත් කොට සඳහිරුසැය ස්ථූපයේ ඉදිරි නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා පාලක විහාරාධිපති ස්වාමීන් වහන්සේගේ නමින් ගිණුමක් ආරම්භ කර, උන්වහන්සේ වෙත භාර දීම සහ තීරණය කර ඇති පරිදි එමඟින් වියදම් දැරීම. | <u>ක්‍රියා කිරීම:</u><br>1. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය<br><br>2. ලේකම්, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br><br>i) සඳහිරුසැය පුණ්‍යභාරය යන අරමුදලට අදාළ භාර ඔප්පු විධිමත් පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අවලංගු කිරීම සහ අදාළ අමාත්‍යාංශ දෙක තීරණය කර ඇති පරිදි සඳහිරුසැය ස්ථූපයේ ඉදිරි නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා අරමුදලේ ශේෂ පාලක විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත භාර දීම.<br><br>ii.) මෙම චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු මෙතෙක් සිදු කරන ලද ආකාරයටම ත්‍රිවිධ හමුදාවේ දායකත්වයෙන් මින් ඉදිරියටත් අඛණ්ඩව සිදු කිරීම යෝග්‍ය වේ. |

| | | |
|---|---|---|
| **4. දීඝවාපිය අරුණ ගිණුම**<br><br>**ආරක්ෂක අමාත්‍යාංශය**<br><br>• අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 20/1408/303/014 වූ "දීඝවාපී චෛත්‍යය ප්‍රතිසංස්කරණය කර සංරක්ෂණය කිරීම සඳහා අරමුදලක් පිහිටුවීම" යන මැයෙන් අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ 2020.09.18 දිනැති සංදේශය සඳහා 2020.09.28 දින එළඹි අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2020.10.16 දිනැති අංක 86 දරන භාර ඔප්පුව මඟින් දීඝවාපී චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ හා සංරක්ෂණ කිරීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත.<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 342.9 ක් වේ. | • දෙස් විදෙස් බැතිමතුන්ගේ මුදල් පරිත්‍යාග, ටිකට්පත් අලෙවි ආදායම සහ ආයෝජන පොලී ආදායම යොදා ගනිමින් දීඝවාපී චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් අවශ්‍ය වියදම් දැරීම.<br><br>• 2025.01.27 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පැවති සමාලෝචන කමිටු රැස්වීමේ දී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් මෙම අරමුදල් පිළිබඳව සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ එකී තීරණය සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත දන්වා එවිය යුතු බව තීරණය විය.<br><br>ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අංක එම්ඕඩී/දීඝවාපිය/3/1 හා 2025.03.11 දිනැති ලිපිය මඟින් දන්වා ඇති පරිදි බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.03.05 දින ආරක්ෂක අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවේ දි පහත සඳහන් තීරණ ගෙන ඇත.<br><br>• දීඝවාපිය චෛත්‍ය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය වෙනුවෙන් ආරම්භ කරන ලද මෙම භාරය නිවැරදි නීතිමය ක්‍රියාමාර්ගයන්ට අනුව අවලංගු කර බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ උපදෙස් හා නීතිරීතීන්ට අනුකූලව මෙම අරමුදල් ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ඉවත්කොට දීඝවාපිය චෛත්‍යයේ ඉදිරි නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා පාලක විහාරාධිපති ස්වාමින් වහන්සේගේ නමින් ගිණුමක් ආරම්භ කර, උන්වහන්සේ වෙත භාර දීම සහ තීරණය කර ඇති පරිදි එමඟින් වියදම් දැරීම.<br><br>• මෙම චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු මෙතෙක් සිදු කරන ලද ආකාරයටම ත්‍රිවිධ හමුදාවේ දායකත්වයෙන් මින් ඉදිරියටත් අඛණ්ඩව සිදු කිරීම යෝග්‍ය බව. | <u>ක්‍රියා කිරීම:</u><br>**1. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය**<br><br>**2. ලේකම්, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**<br><br>i) දීඝවාපිය අරුණ ගිණුම යන අරමුදලට අදාළ භාර ඔප්පු විධිමත් පරිදි අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත අවලංගු කිරීම සහ අදාළ අමාත්‍යාංශ දෙක තීරණය කර ඇති පරිදි දීඝවාපිය චෛත්‍යයේ ඉදිරි නඩත්තු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම සඳහා අරමුදලේ ශේෂ පාලක විහාරාධිපති ස්වාමීන් වහන්සේ වෙත භාර දීම.<br><br>ii.) මෙම චෛත්‍යයේ ප්‍රතිසංස්කරණ කටයුතු මෙතෙක් සිදු කරන ලද ආකාරයටම ත්‍රිවිධ හමුදාවේ දායකත්වයෙන් මින් ඉදිරියටත් අඛණ්ඩව සිදු කිරීම යෝග්‍ය වේ. |

| | | |
|---|---|---|
| 5. උද්භිද උද්‍යාන භාර අරමුදල<br><br>ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව<br>පරිසර අමාත්‍යාංශය<br><br>• 1995.12.15 දිනැති හා 95/30/10/105/221 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට ලබා දුන් කැබිනට් මණ්ඩල අනුමැතියක් මත භාර ඔප්පුවක් යටතේ මෙම අරමුදල 1996 දෙසැම්බර් 20 දින පිහිටුවා ඇත.<br>• උද්භිද උද්‍යානවලට සංචාරකයින් ඇතුළු කිරීමේදී ප්‍රවේශ පත්‍ර වලින් ලැබෙන ආදායමින් 25% ක වටිනාකම මෙම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන අතර, උද්‍යානවල ධාවනයට යොදවා ඇති බැටරි කාර් වලින් (Golf Car) ලැබෙන ආදායම, උද්‍යානවල විකිණීමට තබා ඇති මල් වගා පොත්වලින් ලැබෙන ආදායම, මාර්ගෝපදේශ පත්‍රිකා අලෙවියෙන් ලැබෙන ආදායම සහ සිහිවටන සමරු තිළිණ අලෙවියෙන් ලැබෙන ආදායම මෙම අරමුදලේ වෙනත් ආදායම් ප්‍රභවයන් වේ. | • එම අරමුදල මගින් කරනු ලබන කාර්යයන් වාර්ෂික අයවැය ප්‍රතිපාදන සලසා ගැනීම තුළින් ඉටුකල හැකි බැවින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව මෙම අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතු බව 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාවේ නිර්දේශ කර ඇති අතර, එම නිර්දේශ සඳහා අංක අමප/17/1615/702/002-xvii හා 2017.08.01 දිනැතිව අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.<br><br>• විෂය භාර අමාත්‍යාංශයේ සහ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී 2024.11.06 දින මෙම අරමුදල සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද අතර උද්භිද උද්‍යානවල සංවර්ධන සහ නඩත්තු කටයුතු සඳහා උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරන අතර, අරමුදල සඳහා 2023 වර්ෂයේ රු. මි. 70 ක් වෙන්කර ඇතත්, අරමුදල විසින් උපයෝජනය කර ඇත්තේ ඉන් රු.මිලියන 50 කට ආසන්න මුදලක් පමණක් බවත්;<br>• ජාතික උද්භිද උද්‍යාන අරමුදල හරහා වියදම් දැරීමක් සිදු වී නොමැති බැවින් හා ජාතික අයවැයෙන් ලබාදී ඇති ප්‍රතිපාදන යටතේ පොදු තැන්පත් ගිණුම හරහා පමණක් ගනුදෙනු වාර්තා වී ඇති බැවින් ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවට අදාළ වියදම් දැරීම සඳහා වෙනම අරමුදලක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොපවතින බවත් නිරීක්ෂණය කර ඇත.<br>• මෙම අරමුදලින් ඉටු කරන ලද කාර්යයන් සඳහා ජාතික අයවැය හරහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගත හැකි බවත්, නිරීක්ෂණය කර, අදාළ අමාත්‍යවරයා විමසා අදාළ ලේකම්වරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් හරහා මෙම අරමුදල වසා දැමීම සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු කළ යුතු බවට ඇතිවූ එකඟතාවයට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන ඒ බව අදාළ විෂය භාර අමාත්‍යාංශයට දන්වා යවා ඇත. | <u>ක්‍රියා කිරීම:</u><br>1. ලේකම්, පරිසර අමාත්‍යාංශය<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව<br><br>i) කමිටු නිර්දේශය ප්‍රකාරව අරමුදලේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කර අරමුදල වසා දැමීමට කටයුතු කිරීම.<br><br>ii) අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැය තුළින් සලසා ගැනීම. |

| | | |
|---|---|---|
| 6. ධාන්‍ය චක්‍රීය අරමුදල - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය<br>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය. | අදාළ අමාත්‍යාංශයේ සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් සමග මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී 2025.01.27 දින පැවති රැස්වීම්වලදී හෙළිදරව් වූ කරුණු<br><br>• එවකට නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය මගින් ණය බරින් සිටින ගොවීන්ගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා චක්‍රීය ණය අරමුදලක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 250 ක් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී ඇත.<br><br>• ණය ලබාගැනීමට ගොවීන් මැලි වූ බැවින් හා ණය ආපසු ගෙවීම දුර්වල වූ බැවින් එම අරමුදලේ ක්‍රියාකාරිත්වය නවතා දැමීමට සිදු වී ඇත.<br><br>• ඒ අනුව, රු. මි. 41 ක ණය ආපසු අයකර ගැනීමට ඇති අතර ඉතිරි මුදල් මහා භාණ්ඩාගාරයට බැර කරන ලදී.<br><br>• ඒ අනුව, මෙම අරමුදල ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති අතර ලබා දී ඇති රු.මි.41ක ණය මුදල ආපසු අයකර ගැනීමේ කටයුතු පමණක් ඉතිරිව ඇත. | <u>ක්‍රියා කිරීම:</u><br>1. ලේකම්- රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.<br><br>මෙම අරමුදල වසා දමා, ණය මුදල්වලින් කෙරෙන ණය වාරික අයකිරීම් සහ පොළී අය කිරීම් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ගිණුම්ගත කිරීමට කටයුතු කිරීම. |
| 7.ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල **(Fuel Price Stabilization Fund)**<br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br>මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br>•ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල වැඩිවීමේ දී හා අඩුවීමේදී සිදුවන දේශීය මිල උච්ඡාවචනයන් පාලනය කර ස්ථාවර මිලක් පවත්වා ගැනීමේ අරමුණින්, අමප 20/0667/201/015 හා 2020.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම අරමුදල පිහිටුවා ඇත. | • මෙම අරමුදලට අඛණ්ඩ පැවැත්මක් නොමැති බවත්, අරමුදල අහෝසි කිරීම සඳහා කඩිනමින් අමාත්‍ය මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට යෝජිත බවත්, එහි ගනුදෙනු හා වගකීම් පියවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය විසින් භාර ගැනීම, ඇවර කිරීම යනාදිය සම්බන්ධව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිත බවත් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2021.11.25 දින විගණනයට දැනුම් දී තිබුණ ද මෙම කටයුතු 2023.03.24 දින වන විටත් සිදු කර නොතිබූ බව 2022 වර්ෂය සඳහා ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල සඳහා වන විගණන වාර්තාවේ දක්වා ඇත.<br><br>• ඒ අනුව මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය වේ. | <u>ක්‍රියා කිරීම</u><br>**1.**අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව<br><br>මෙම අරමුදල සම්බන්ධයෙන් අදාළ තොරතුරු සොයා බලා, අරමුදල වසා දැමීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම ඇතුළු අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම. |

| | | |
|---|---|---|
| **8.** ජාතික ළමා ආරක්ෂණ අරමුදල<br><br>ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>• ගැසට් පත්‍ර අංක 1692 (2011.02.03) මගින් මෙම අරමුදල පිහිටුවීම පිළිබඳ කරුණු දක්වා ඇත.<br>• ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය යටතේ අරමුදලේ කටයුතු සිදු කරනු ලබන අතර එම මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සෑම ආකාරයෙන්ම උපකාර හා අධාර අවශ්‍යවන දරුවන් සඳහා සහයෝගය ලබා දීම මෙහි අරමුණ වේ.<br>• 2023.12.31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද වාර්ෂික ගිණුම් ප්‍රකාශන අනුව මෙම අරමුදලේ ශේෂය රු. මි. 1.69 ක් වේ. | • මෙම අරමුදල 2006 සුනාමි තත්ත්වය සම්බන්ධයෙන් වූ යම් ලැබීම් හා ගෙවීම්වලින් සමන්විත වන අතර, මෙම අරමුදල වසා දමා එහි ශේෂය ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අරමුදල වෙත බැර කළ යුතු බවට 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටුව විසින් නිර්දේශ කර ඇත.<br>• පරිත්‍යාගශීලීන්ගෙන් ත්‍යාග වශයෙන් ලැබෙන මුදල් මෙම අරමුදලට බැර කරන අතර, දැනට අරමුදල සඳහා දේශීය පරිත්‍යාගශීලයකුගෙන් මාසිකව ලැබෙන රු. 3,000 ක පරිත්‍යාගයට අමතරව මහජන බැංකුවේ තැන්පතු ලෙස රු. 500, 000 ක මුදලක් පවතී.<br>• මෙම අරමුදලේ කටයුතු සඳහා වෙනම ගිණුම් පොත්පත් පවත්වා ගැනීමක් සිදු නොකරන අතර ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික ගිණුම යටතේ මෙම අරමුදල පිළිබඳ තොරතුරු වාර්තා කරනු ලැබේ.<br>• මෙම අරමුදලෙහි වාර්ෂිකව ප්‍රමාණවත් ගනුදෙනු සංඛ්‍යාවක් සිදුවී නොමැති වීම හේතුවෙන් හා අදාල කටයුතු ජාතික ළමා ආරක්ෂක අධිකාරිය යටතේ සිදු කළ හැකි බැවින් මෙම අරමුදල වසා දැමීමට කටයුතු කිරීම. | <u>ක්‍රියා කිරීම:</u><br>**1.** ලේකම්, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br>**2.** අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>රා.මු.ව. 4/2024 හි සඳහන් විධිවිධාන අනුව ඉදිරි පියවරයන් අනුගමනය කොට මෙම අරමුදල වසා දැමීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම |
| **09.** ජාතික වකුගඩු අරමුදල<br><br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය<br>• 2015 අතුරු අයවැය මගින් ජාතික වකුගඩු අරමුදලක් පිහිටුවීමට යෝජනා කර ඇති බවත්, ඒ අනුව, 2015.05.14 දිනැති "ජාතික වකුගඩු අරමුදල පිහිටුවීම" මැයෙන් වූ අංක 15/0627/601/009 දරන | • වකුගඩු රෝගය තවදුරටත් ව්‍යාප්තවීම වැළැක්වීම සහ දැනට රෝගය නිසා පීඩාවට පත්ව ඇති රෝගීන් සහ ඔවුන්ගේ පවුල්වල අයගේ සුභසාධනය සැලසීමත්, R.O. Plants පිහිටුවීම සහ නඩත්තු කිරීමත් මෙම අරමුදල මගින් සිදු කිරීමට අපේක්ෂා කරයි.<br>• මෙම අරමුදලේ ආදායම් මූලාශ්‍ර වනුයේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන ලකී 7 (සිකුරාදා) ලොතරැයිපත් ආදායම, පරිත්‍යාග සහ ආයෝජන පොළිය වේ. | <u>ක්‍රියා කිරීම</u><br>**1.** ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය<br><br>**2.** ලේකම්, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>i.) ජාතික වකුගඩු අරමුදලේ ශේෂය දැනටමත් ව්‍යවස්ථාපිත අරමුදලක් ලෙස ක්‍රියාත්මක වන ජාතික |

| | | |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල සටහන මඟින් ජනාධිපති කාර්යාලය යටතේ ජාතික වකුගඩු අරමුදලක් පිහිටුවීමට අනුමැතිය ඉල්ලා ඇති බවත්, ඒ සඳහා 2015.05.27 දින ලද අමාත්‍ය මණ්ඩල තීරණයක් මත මෙම අරමුදල පිහිටුවා ඇත.<br>• ජනාධිපති කාර්යාලය යටතේ වූ ජාතික වකුගඩු අරමුදල 2019.12.10 දිනැති අංක 2153/12 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට පවරා ඇත.<br>• 2024/11/25 දිනැති අංක 2412/08 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් මෙම අරමුදල ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය යටතට පවරා ඇති අතර, එය නැවත සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනීම සඳහා ජනාධිපති කාර්යාලය වෙතින් 2024.12.27 දින ඉල්ලීම් කර ඇත.<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.25.081 කි | • 2024 අයවැය ඇස්තමේන්තුවෙන් වකුගඩු රෝග නිවාරණය සඳහා වෙන් කළ ප්‍රතිපාදන ඌණ උපයෝජිතව ඇති බැවින්, වකුගඩු රෝග නිවාරණය කිරීමේ අරමුණින් මෙම අරමුදල පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැත.<br>• 2023 වර්ෂයේ අරමුදලේ මුළු ආදායම රු.22,600 ක පරිත්‍යාගයක් පමණක් බවත්, අරමුදලේ ආරම්භක ශේෂය ලෙස පැවති රු.මි. 29.5ක මුදලින්, 2023 වර්ෂයේ රු.මි.24.6 ක වියදම් දරා ඇති බවත් නිරීක්ෂණය වන අතර අරමුදලේ ශේෂය 2023.12.31 දිනට රු.මි.4.9 ට අඩුවී ඇත. ඒ අනුව වර්ෂය තුල ප්‍රමාණවත් ගනුදෙනු ප්‍රමාණයක් මෙම අරමුදලින් සිදුව නොමැත.<br>• එම කාර්යය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ජාතික අයවැය මඟින් වාර්ෂිකව වෙන්කළ හැකි අතර ඒ සඳහා විධිමත් සැලසුමක් සමග අවශ්‍ය ප්‍රතිපාදන සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. | සෞඛ්‍ය සංවර්ධන අරමුදලට මාරුකොට වකුගඩු අරමුදල වසා දැමීම සහ ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සටහනක්/ සංදේශයක් මගින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.<br><br>ii.) මෙම කාර්යයන් සඳහා අවශ්‍ය වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණය, එය උපයෝජනය කර ගැනීමේ විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් ද සමඟින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම. |
| **10.** ප්‍රාසාංගික කලාකරුවන් සඳහා වන ජනාධිපති සුභසාධන අරමුදල<br><br>ටවර් හෝල් රඟහල පදනම බුද්ධ ශාසන, ආගමික කටයුතු සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ටවර්හෝල් රඟහල පදනමේ නිලධාරීන් 2025.05.20 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පැවති රැස්වීමේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>• ප්‍රසාංගික කලාවන් වෙනුවෙන් සිය ජීවිත කාලය කැප කොට එම කලා මාධ්‍යවල ප්‍රමිතීන් උසස් කිරීම සඳහා විශිෂ්ට සේවාවක් සිදුකාට වයෝවෘද්ධ වූ විට ඔවුන්ගේ සේවය | <u>ක්‍රියා කිරීම</u><br>**1.** ලේකම්, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br><br>**2.** අධ්‍යක්ෂ ජනරාල්, ටවර් හෝල් රඟහල පදනම |

| | | |
|---|---|---|
| | අරමුදලක් ස්ථාපනය කර ඇති මූලාශ්‍රයේ නෛතික භාවය, අරමුදලේ විකාශනය හෝ පසුබිම සොයා ගැනීමට ප්‍රමාණවත් තොරතුරු නොමැත.<br>• 2012 වසරේ සිට අරමුදලේ පවතින මුදල් යොදවා ගෙන පොල් ආශ්‍රිත කර්මාන්ත කරුවන්ට මූල්‍ය සහාය ලබාදීම සඳහා රාජ්‍ය බැංකු හරහා ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇති අතර, මේ වනවිට ප්‍රතිලාභීන් තුන්සියයක් පමණ ණය ලබාගෙන ඇත.<br>• දේශීය පොල්තෙල් කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා දේශීය පොල්තෙල් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය කුඩා පරිමාණ කර්මාන්තකරුවන්ට ආනයනය කර ලබාදීමට හා ඔවුන්ගේ නිෂ්පාදන එකලස් කර පොල් සංවර්ධන අධිකාරියේ ලේබලය යටතේ බෝතල් කර පාරිභෝගික ජනතාවට සාධාරණ මිලකට ලබාදීමට මේ වනවිට අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර ඇත.<br>• 2025.02.10 දිනැති රජයට අයත් වාණිජමය නොවන ආයතනයන් පිළිබඳව සමාලෝචන කමිටුවේ වාර්තාවට අනුව, පොල් වගා කිරීමේ මණ්ඩලය, පොල් සංවර්ධන අධිකාරිය සහ කිතුල් සංවර්ධන මණ්ඩලය යන ආයතන තුන ඒකාබද්ධ කොට එක් කළමණාකාරිත්වයක් යටතේ ක්‍රියාත්මක කිරීමට කමිටුවක් පත් කර ඇත. | |
| **12.** මහින්දෝදය ශිෂ්‍යත්ව අරමුදල<br>අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>• 2014.04.03 දිනැති CM14/0473/530/016 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි භාර ඔප්පුවක් යටතේ මෙම අරමුදල පිහිටුවා ඇත.<br>• අඩු ආදායම්ලාභී පිරිමි සිසුන්ට, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා අසියානු සංවර්ධන බැංකුවෙන් ලද ප්‍රදානයක් | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව 2016.06.12 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් මෙම අරමුදල වසා දැමීමට තීරණය කර ඇති බවත්, ඒ අනුව, මෙම අරමුදලේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කර අරමුදල වසා දමන ලෙසත් නිර්දේශ කර ඇත.<br><br>• මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමඟ 2025.03.06 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති අරමුදල් සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද අතර, එහිදී මේ යටතේ තිබූ රු. 136,525,754.31ක මුදල ඒකාබද්ධ අරමුදලට බැර කර ඇති බවත් තවදුරටත් රු. 230,479ක | <u>ක්‍රියා කිරීම:</u><br>**1.** ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය<br>**2.**මහා භාරකාර තැන, මහා භාරකාර දෙපාර්තමේන්තුව<br>(i) මහා භාරකාර තැනගේ අංක PT/6/4/3/966/TR හා 2025.05.08 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි කටයුතු කොට අරමුදල වසා දැමීම. |

| | | |
|---|---|---|
| • 1996.11.18 දින පැවැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත මෙම අරමුදල පිහිටුවා ඇති බව වාර්තා කර ඇත.<br><br>• 2024.12.31 දිනට ස්ථාවර තැන්පතුවල වටිනාකම රු.මි. 80.8 කි. | ගැන සලකා බලා මාසික දීමනාවක් ලබා දීම අරමුදලේ අරමුණ වේ.<br><br>• අරමුදල නමින් ඇති ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමෙන් ලැබෙන පොලී මුදල් ප්‍රධාන ලැබීම් මූලාශ්‍රය වේ.<br><br>• අරමුදලේ ශේෂය ආයතනයේ ගිණුමට මාරු කොට අරමුදල මගින් සිදු කරනු ලබන කාර්යයන් ටවර්හෝල් රඟහල පදනමේ අරමුදල හරහා සිදු කිරීමට බාධාවක් නොමැති බව අදාල නිලධාරින් ප්‍රකාශ කරන ලදි.<br><br>• මෙහිදී අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අදාළ අරමුදල පිහිටුවා ඇති බැවින් අරමුදල අවසන් කිරීමේ දී අමාත්‍ය මණ්ඩල සටහනක් /සංදේශයක් මගින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කළ යුතුවේ . | i.) මෙම අරමුදලේ ශේෂය ටවර්හෝල් රඟහල පදනම අරමුදලට මාරු කිරීමටත් ටවර්හෝල් රඟහල පදනම අරමුදල යටතේ මෙම අරමුදල මගින් සිදු කරන ලද කාර්යයන් සිදු කිරීමටත් කටයුතු කිරීම.<br><br>ii.) මෙහිදී අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අදාළ අරමුදල පිහිටුවා ඇති බැවින් අරමුදල අවසන් කිරීමේ දී අමාත්‍ය මණ්ඩල සටහනක් /සංදේශයක් මගින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කිරීම. |
| **11. පොල් තෙල් මිල ස්ථායිකරණ අරමුදල පොල් සංවර්ධන අධිකාරිය වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 439.62 කි. | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, රජය පොල් තෙල් මිලට ගැනීම සහ ගබඩා කිරීම වැනි ව්‍යාපාරික කටයුතු මේ වන විට සිදු නොකරන බැවින් මෙලෙස අරමුදලක් අවශ්‍ය නොවන බව නිර්දේශ කර ඇත.<br>පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරින් සමග 2025.05.20 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ පැවැති අරමුදල් සමාලෝචන කමිටුවේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් විය.<br>• දේශීය තෙල් නිෂ්පාදනය වැඩි කාලවලදී එම අතිරික්ත තෙල් තොග ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු ටැංකිවල ගබඩාකර දේශීය තෙල් නිෂ්පාදනය අඩු කාලවලදී වෙළඳපලට නිකුත් කිරීම තුළින් දේශීය තෙල් මිල උච්චාවචනය වීම පාලනය කිරීමට මැදිහත් වීම සඳහා අරමුදල පිහිටුවා ඇත.<br>• මෙම අරමුදල අදාල කාර්යය සඳහා යොදවා ගැනීම වසර 40කට අධික කාලයක සිට ක්‍රියාත්මක වී නොමැති බවත්, එබැවින් | <u>ක්‍රියා කිරීම:</u><br>**1.** ලේකම්, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය<br>**2.** සභාපති, පොල් සංවර්ධන අධිකාරිය<br><br>i.) මෙම අරමුදල වසා දමා එහි ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.<br><br>ii.) දේශීය පොල්තෙල් කර්මාන්තය ආරක්ෂා කිරීමට යෝජිත ව්‍යාපෘති අයවැය ප්‍රතිපාදන යටතේ සිදු කිරීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| මත මෙම අරමුදල පිහිටුවා ඇත. | මුදලක් භාරකාර දෙපාරත්මේන්තුවේ ශේෂව පවතින බවත් වාර්තා කරන ලදි .<br><br>• එම රු. 230,479ක මුදල 2025.08.15 දින ආයෝජනය කල් පිරුණු පසු එම මුදලෙන් මහින්ද රාජපක්ෂ මහතාට අයත් මුදල, භාරකාර දෙපාර්තමේන්තුවේ පවතින ඒ මහතාට අයත් "මහින්ද රාජපක්ෂ මධ්‍යස්ථාන භාරය" වෙත මාරු කොට ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැරකරන බව මහාභාරකාර දෙපාර්තමේන්තුවේ මහාභාරකාර තැන විසින් ඔහුගේ අංක PT/6/4/3/966/TR හා 2025.05.08 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. | |
| **13.** චක්‍රීය අරමුදල<br>නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය<br><br>2004.10.29 දිනැති කැබිනට් පත්‍රිකා අංක 04/1434/034/007 මගින් මෙම අරමුදල ස්ථාපිත කර ඇත. | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව එම කමිටුව විසින් මෙම අරමුදල අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමට නිර්දේශ කර ඇත.<br><br>මේ සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් සමඟ 2025.05.20 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති අරමුදල් සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු<br><br>• ව්‍යාපෘතිවල වාර්ෂික ලාභයෙන් ඒ ඒ ව්‍යාපෘතිය අනුව 10%, හෝ 20%ක ප්‍රමාණයක් වාර්ෂිකව ව්‍යාපෘති අරමුදලින් චක්‍රීය අරමුදල වෙත මාරු කිරීම සිදු කෙරේ.<br><br>• දැනට මෙම අරමුදලෙන් වියදම් දැරීමක් සිදු නොකරන අතර වාර්ෂිකව ව්‍යාපෘති ලාභයෙන් මාරු කරන ප්‍රමාණය සමුච්චිත අරමුදලක් ලෙස පවත්වාගන යනු ලැබේ.<br><br>• මෙම චක්‍රීය අරමුදල මගින් සිදු කරන ලද කටයුතු ආයතනයේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් සමග ඒකාබද්ධ කර ඉදිරියට පවත්වාගන යෑම සිදු කළ හැකි බව නිරීක්ෂණය විය.<br><br>• 2025.02.10 දිනැති රජයට අයත් වාණිජමය නොවන ආයතනයන් පිළිබඳ සමාලෝචන වාර්තාවට අනුව නවීන තාක්ෂණය පිළිබඳ ආතර් | <u>ක්‍රියාත්මක කිරීම</u><br>**1. ලේකම්, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය**<br>**2. අධ්‍යක්ෂ ජනරාල්, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය**<br><br>(i) මෙම චක්‍රීය අරමුදලේ ශේෂය ආයතනයේ සාමාන්‍ය ගිණුමට මාරු කොට ආයතනයේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කර ඉදිරියට පවත්වාගෙන යාම.<br><br>(ii) මෙම අරමුදල අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් පිහිටුවා ඇති බැවින් අරමුදල අවසන් කිරීමේ දී අමාත්‍ය මණ්ඩල සටහනක්/ සංදේශයක් මඟින් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | සී ක්ලාක් ආයතනය එහි නම වෙනස් කිරීමකින් තොරව මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධ පර්යේෂණ අංශයක් බවට පත්කිරීමට නිර්දේශ කර ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. | |
| 14. ව්‍යාපෘති අරමුදල<br><br>නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය<br><br>විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය | මේ සම්බන්ධයෙන් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනයේ නිලධාරීන් සමඟ 2025.05.20 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති අරමුදල් සමාලෝචන රැස්වීමේදී සාකච්ඡා කරන ලද අතර එහිදී පහත කරුණු නිරීක්ෂණය කරන ලදී.<br><br>• ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන උපදේශන සේවා සඳහා සහ පාඨමාලා සඳහා අය කරනු ලබන ගාස්තු මෙම අරමුදලට බැර කෙරේ.<br>• පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය සහ නව තාක්ෂණික නවෝත්පාදන දිරිගැන්වීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ඒවාට අදාළ ලැබීම් හා ගෙවීම් කටයුතු සිදුකිරීම හා විද්‍යාඥයින්, ඉංජිනේරුවන්, තාක්ෂණික හා අනෙකුත් නිලධාරීන්ගේ කාර්ය සාධනය පදනම්වූ දිරිදීමනා ලබාදීම මෙම අරමුදලේ ප්‍රධාන කාර්යයන් වෙයි.<br>• දැනට අරමුදල සතුව රු. මි. 88.8ක ස්ථාවර තැන්පතු හා රු. මි. 17 ක භාණ්ඩාගාර බිල්පත් ඇත.<br>• 1984 අංක 30 දරන නවීන තාක්ෂණ විද්‍යාව පිළිබඳ ආතර් සී ක්ලාක් පනතේ 21 වන වගන්තිය අනුව ආතර් සී ක්ලාක් ආයතනයට ප්‍රදාන ලබා ගැනීමටත්, 23 වගන්තිය ප්‍රකාරව අරමුදලක් පවත්වාගන යෑමටත් බලය ඇත.<br>• 2025.02.10 දිනැති රජයට අයත් වාණිජමය නොවන ආයතනයන් පිළිබඳ සමාලෝචන වාර්තාවට අනුව නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය එහි නම වෙනස් කිරීමකින් තොරව මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධ පර්යේෂණ අංශයක් බවට පත්කිරීමට නිර්දේශ කර ඇති බැවින් ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. | <u>ක්‍රියාත්මක කිරීම</u><br>1. ලේකම්, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය<br><br>i) මෙම ව්‍යාපෘති අරමුදලේ ශේෂය ආයතනයේ සාමාන්‍ය ගිණුමට මාරු කොට ආයතනයේ සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාකාරකම් සමග ඒකාබද්ධ කර එම කටයුතු ඉදිරියටත් පවත්වාගන යාම. |

| | | |
|---|---|---|
| 15) සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 87.117 කි.<br><br>16) සේවා නියුක්තිකයන්ගේ ණය අරමුදල<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 0.7128 කි.<br><br>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | • මෙම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් සම්බන්ධයෙන් 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, කමිටුව විසින් පහත සඳහන් නිර්දේශ ලබා දී ඇත.<br>• මෙම ආයතනය පවත්වාගෙන යන අරමුදල් අතුරින් සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ ණය අරමුදල යන අරමුදල්වල කටයුතු අවසන් කළ යුතු වීම.<br>• තවදුරටත් මෙම අරමුදල් සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීමේ දී හා එම නිලධාරීන් සමඟ 2025.01.30 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාවේදී පහත කරුණු හෙළිදරව් විය.<br>• ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල වෙනමම අරමුදලක් ලෙස ක්‍රියාත්මක කිරීම සුදුසු නොවන බැවින්, ඒ සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රමවේදයක් සකස් කර මෙම අරමුදල වසා දැමීමට කටයුතු කිරීම සුදුසු බවත්;<br>• ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන සේවා නියුක්තිකයන්ගේ ණය අරමුදල යටතේ ඇති ණය ශේෂයන් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට මාරු කර අරමුදල වසා දැමීමට කටයුතු කිරීම සුදුසු බවත්;<br>තීරණය කර ඇත. | ක්‍රියා කිරීම:<br>1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය<br><br>2. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>මෙයට පෙර සාකච්ඡාවලදී ලබා දුන් නිර්දේශ ද සැලකිල්ලට ගෙන සේවා නියුක්තිකයන්ගේ ණය අරමුදල හා සමෘද්ධි ක්ෂුද්‍ර මූල්‍ය ලිපි ද්‍රව්‍ය චක්‍රීය අරමුදල සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| 17. සේවක සුභසාධක අරමුදල<br><br>ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය<br><br>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, කමිටුව විසින් සේවක සුබසාධන අරමුදල නමින් අරමුදලක් හඳුනාගෙන ඇත.<br>• ප්‍රධාන කාර්යාලයේ පැවති "කෝවිඩ් " අරමුදල ද, රජයේ ආයතනවලට සපයනු ලබන උපදේශන සේවාවලින් උපයන මුදලින් 10% ක්ද, හිටපු සභාපතිවරයෙකුගේ මාසික වේතනය ද සහ ආපදා ණය දීමෙන් උපයාගත් පොළියෙන් 4% ක්ද මඟින් මෙම අරමුදල සමන්විත වන බව 2025.03.14 දින පැවති රැස්වීමේදී ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් විසින් දැනුම් දී ඇත. | • මෙම අරමුදල උප අරමුදල් හතරකින් සමන්විත වන බව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් දැනුම් දී ඇති බැවින් ඒවා වෙන වෙනම විශ්ලේෂණය කරන ලදී.<br>i) කෝවිඩ් විශේෂ අරමුදල<br>ii) නැසී ගිය සේවක නිධන් අරමුදල<br>iii) වෘත්තීය ආදායම් අරමුදල<br>iv) සභාපතිතුමාගේ වැටුප (හිටපු) |

| | | |
|---|---|---|
| 18. කෝවිඩ් විශේෂ අරමුදල<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br><br>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.5.16 කි. | • සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ මගින් මෙම අරමුදල ස්ථාපිත කර ඇති අතර මණ්ඩලීය සේවක ප්‍රජාව වෙත කෝවිඩ් සමයේ අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා නේවාසික පහසුකම් හා භාණ්ඩ සැපයීම සිදුකර ඇත.<br><br>• අරමුදලේ කාර්යයන් සඳහා ජාතික අයවැය තුළින් ප්‍රතිපාදන සලසා නොමැති අතර අරමුදලෙහි ලැබීම් මූලාශ්‍ර වනුයේ සේවක ප්‍රදානයන්ය. | ක්‍රියා කිරීම:<br>1.ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය.<br><br>2.සාමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය.<br>සේවකයන් විසින් මෙම අරමුදල සඳහා සිදු කරන ලද ප්‍රදාන නැවත ඔවුන් වෙත ලබා දී මෙම අරමුදල වසා දැමීමට කටයුතු කිරීම. |
| 19. නැසී ගිය සේවක නිධන් අරමුදල<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br><br>නාගරික සංවර්ධන ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.5.49 කි. | • සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ මගින් මෙම අරමුදල ස්ථාපිත කර ඇති අතර මණ්ඩලයේ නැසී ගිය ණයගැති සේවකයින්ගේ ණය ශේෂ කපා හැරීම සිදුකර ඇත.<br><br>• අරමුදලේ කාර්යයන් සඳහා ජාතික අයවැය තුළින් ප්‍රතිපාදන සලසා නැත.<br><br>• අරමුදලෙහි ලැබීම් මූලාශ්‍ර වනුයේ ණය වාරික මත පනවන ලද අධිභාරයන්ය. | ක්‍රියා කිරීම:<br>1.ලේකම්, නාගරික සංවර්ධන ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය<br><br>2. සාමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය<br><br>සේවකයින්ගේ දායකත්වයෙන් පමණක් ක්‍රියාත්මක වන අරමුදලක් බැවින්, රජයේ නොවන අරමුදලක් ලෙස හඳුනා ගත් අතර, එබැවින් මණ්ඩලයේ අවසන් ගිණුම් වලින් මෙම අරමුදලට අදාල ගිණුම් වාර්තා ඉවත් කර සුභසාධක අරමුදලක් වශයෙන් පවත්වාගෙන යාම. |
| 20. වෘත්තීය ආදායම් අරමුදල<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br><br>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | • සාමාන්‍යාධිකාරී චක්‍රලේඛ මගින් අරමුදල ස්ථාපිත කර ඇති අතර මණ්ඩලීය විද්වතුන් බාහිර ආයතනවලට ලබාදෙන වෘත්තීය සේවා මත ලැබූ ආදායමෙන් 10% බැගින් බැර කර අරමුදල සකස් කර ඇත. | ක්‍රියා කිරීම:<br>1. ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය |

| | | |
|---|---|---|
| • 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.3.86 කි. | • ආයතනය විසින් සපයනු ලබන උපදේශන සේවා සඳහා ලැබෙන ආදායම් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ අදායමකි.<br>• ඒ සඳහා සම්බන්ධවන නිලධාරීන්ට අභිප්‍රේරණය උදෙසා දීමනාවක් ගෙවීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා විධිමත් අනුමැතියන් යටතේ මණ්ඩලය විසින් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතු බව. | 2. සාමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br>i) අරමුදලේ ශේෂය ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ගිණුමට මාරු කොට අරමුදල වසා දැමීමට කටයුතු කිරීම.<br>ii.) උපදේශන සේවා හා සම්බන්ධවන නිලධාරීන්ට පුහුණු අභිප්‍රේරණ දීමනා ක්‍රමයක් අවශ්‍යවන්නේ නම් නියමිත අනුමැතියක් මත මණ්ඩලයේ වියදම් යටතේ සිදු කිරීම. |
| **21.** සභාපතිතුමාගේ වැටුප (හිටපු)<br><br>ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය<br><br>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.2.79 කි. | • හිටපු සභාපතිතුමෙකුගේ ඉල්ලීම පරිදි අරමුදල ස්ථාපිත කර ඇති අතර සභාපති වැටුප සමාජ සත්කාර සඳහා යොදා ගැනීම සිදුකර ඇති බව නිලධාරීන් විසින් දැනුම් දී ඇත.<br>• අරමුදලේ කාර්යයන් සඳහා ජාතික අයවැය තුළින් ප්‍රතිපාදන සලසා නැත.<br>• මෙම අරමුදලේ ආදායම් මූලාශ්‍ර වනුයේ සභාපති වැටුප නිසාත්, රජයේ අරමුදල් ආදායම් මූලාශ්‍රයක් නොවන නිසාත් මෙය සෘජුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන අරමුදලක් නොවන බව පෙනී යයි. | <u>ක්‍රියා කිරීම:</u><br>1. ලේකම්, නාගරික සංවර්ධන ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය<br><br>2. සාමාන්‍යාධිකාරී, ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය<br><br>මෙම අරමුදලෙහි ශේෂය ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ සමාන්‍ය ගිණුමට බැර කොට අරමුදල වසා දැමීම. |
| **22.** ප්‍රාග්ධන සංවර්ධන අරමුදල<br><br>පොල් සංවර්ධන අධිකාරිය<br><br>වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව කමිටුව විසින් මෙම අරමුදල සමාලෝචනය කර නොමැති බව නිරීක්ෂණය වේ.<br>• පොල් සංවර්ධන අධිකාරියේ පවතින අංශ තුන සඳහා මහා භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන ප්‍රදාන | <u>ක්‍රියා කිරීම:</u><br>1. ලේකම්, වැවිලි හා ප්‍රජා යටිතල පහුසුකම් අමාත්‍යාංශය<br><br>2. සභාපති, පොල් සංවර්ධන අධිකාරිය |

| | | |
|---|---|---|
| | භාවිතා කරමින් ප්‍රාග්ධන සංවර්ධන අරමුදල නිර්මාණය කරන ලද බව පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන් රැස්වීම්වලදී ප්‍රකාශ කර ඇත.<br>• පොල් සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා අදාළ කටයුතු කිරීම සහ රසායනාගාර විශ්ලේෂණ කටයුතු කිරීම මෙම අරමුදලේ කාර්යයභාරය වේ.<br>• මෙම අරමුදල සඳහා 2021 වර්ෂය දක්වා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාදී ඇත.<br>• විගණන නිරීක්ෂණ හේතුවෙන් සහ අධිකාරියෙහි අනුමැතිය මත 2024 වර්ෂයේ සිට මෙම අරමුදල පුනරාවර්තන ගිණුම සමඟ ඒකාබද්ධ කොට ගිණුම සකස් කොට ඇත.<br>• ඒ අනුව, පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ පැහැදිලි කිරීම අනුව ප්‍රාග්ධන සංවර්ධන අරමුදල නමින් ශේෂයක් හෝ අරමුදලේ ක්‍රියාකාරීත්වයක් හෝ නොමැත. | පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ පැහැදිලි කිරීම අනුව මේ වනවිට අරමුදල පුනරාවර්තන ගිණුම සමඟ ඒකාබද්ධ කර ඇති බැවින්, අරමුදලේ ක්‍රියාකාරීත්වය අවසන් කර ඇත. එබැවින්, මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවේ. |
| **23.** ණය ඇපකර අරමුදල<br><br>**භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**<br><br>**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>• දේපල ණය ලබාගෙන මියගිය හෝ පූර්ණ අකර්මණ්‍ය තත්ත්වයට පත් වූ රජයේ නිලධාරීන් ලබා ගත් ණය නිරවුල් කිරීම සහතික කිරීම සඳහා මෙම අරමුදල ආරම්භ කරන ලදි.<br>• 2024.12.31 දිනට අරමුදලේ ශේෂය රු.මි. 2,050.67 කි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අංක TOD/FOA/ණය ඇපකර/චක්‍රලේඛ හා 2025.07.02 දිනැති ලිපිය මඟින් පහත කරුණු වාර්තා කර ඇත.<br><br>• 2005 අයවැය යෝජනාවක් අනුව සෑම රජයේ සේවකයකුටම දේපළක් අත්කර දීම අරමුණු කර ගෙන නිවාස ණය සඳහා බැංකු ක්‍රමය උපයෝගී කරගෙන නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ ණය ලබාගත් නිලධාරියකු මිය ගියේ නම් හෝ පූර්ණ අකර්මණ්‍ය තත්ත්වයට පත්වූයේ නම් ඔහුගේ ණය මුදල ගෙවීම සහතික කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව භාරයේ ණය ඇපකර අරමුදල පිහිටුවා ඇත.<br><br>• 2005.04.26 දිනැති අයවැය චක්‍රලේඛ 122 යටතේ අරමුදල පවත්වාගෙන යාම, ආයෝජන කටයුතු කිරීම, ආයෝජන වලට ලැබෙන පොලිය හා ගෙවිය යුතු ණය වාරික සම්බන්ධ කටයුතු කිරීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.<br><br>• ණය ඇපකර අරමුදල පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු සඳහා 2005 වර්ෂයේ අයවැය | <u>**ක්‍රියා කිරීම:**</u><br><br>**1.** අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව<br><br>i.) 2025.12.31 දිනට මෙම අරමුදල යටතේ පවතින පොදු තැන්පත් ගිණුමේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැරකර, මෙම අරමුදල වසා දැමීමට සහ මෙම අරමුදල මඟින් දැනට සිදු කරනු ලබන කටයුතු ඒකාබද්ධ අරමුදල යටතේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන වාර්ෂික අයවැය |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තුව විසින් 801-07-02-2501 වැය ශීර්ෂය යටතේ රු. මි. 1000 ක ප්‍රතිපාදන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට මාරු කිරීමෙන් අරඹන ලදී.<br><br>• ඒ අනුව 2007 වර්ෂය ආරම්භයත් සමඟ මියගිය ණයලාභීන්ට ගෙවීම් කටයුතු ආරම්භ කිරීම සඳහා ණය ඇපකර අරමුදල් නමින් පොදු තැන්පත් ගිණුමක් ආරම්භ කරන ලදී.<br><br>• 2025.05.31 දිනට අරමුදලේ ශේෂය රු.2,036,508,998.47 ක් වන අතර අරමුදලට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි රු.1,981,391,805.52 භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇති අතර රු. 55,117,192.95 ක මුදලක් පොදු තැන්පත් ගිණුමේ ශේෂව පවතී.<br><br>• මෙම අරමුදල උපයෝගී කර ගනිමින් පසුගිය වර්ෂ 3හි සිදුකරන ලද සාමාන්‍ය ගෙවීම් රු.මි. 100 පමණ ප්‍රමාණයක් බැවින් අරමුදල යටතේ පවතින පොදු තැන්පත් ගිණුම වසා එහි ශේෂය ඒකාබද්ධ අරමුදලට බැරකර, මෙම අරමුදල මඟින් දැනට සිදු කරනු ලබන කටයුතු ඒකාබද්ධ අරමුදල යටතේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන වාර්ෂික අයවැය ප්‍රතිපාදන මගින් ගෙවීම් කටයුතු කිරීමට ද හැකියාව ඇත.<br><br>• 2025.12.31 දිනට මෙම අරමුදල යටතේ පවතින පොදු තැන්පත් ගිණුමේ ශේෂය ඒකාබද්ධ අරමුදලට බැරකර, මෙම අරමුදල වසා දැමීමට සහ මෙම අරමුදල මඟින් දැනට සිදු කරනු ලබන කටයුතු ඒකාබද්ධ අරමුදල යටතේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන වාර්ෂික අයවැය ප්‍රතිපාදන මගින් ගෙවීමට කටයුතු කිරීම සහ මෙම අරමුදලින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල කර ඇති ආයෝජනයන්ට අදාල ප්‍රාග්ධන වටිනාකම සහ පොලිය කල් පිරීමේ දිනයේදී ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. | ප්‍රතිපාදන මගින් ගෙවීමට කටයුතු කිරීම.<br><br>ii.) මෙම අරමුදලින් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල කර ඇති ආයෝජනයන්ට අදාල ප්‍රාග්ධන වටිනාකම සහ පොලිය කල් පිරීමේ දිනයේදී ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කිරීම. |

## 6.3 සංවිධාන ව්‍යුහය වෙනස් කළ යුතු අරමුදල්

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර කෙටියෙන් | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල්<br><br>වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය<br><br>1. නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>2. රත්මලාන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>3.මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>4.පිළියන්දල විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකාර භාර අරමුදල<br>5. වැලිසර විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>6.වේයන්ගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>7. දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>8.ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, කමිටුව පහත සඳහන් කරුණු නිරීක්ෂණය කර ඇත.<br><br>• මෙම ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ දී අපේක්ෂා කරන ලද අරමුණු ඉටුවන ආකාරයට ආර්ථික මධ්‍යස්ථාන සියල්ල වඩාත් විධිමත් කළමනාකරණ ව්‍යුහයක් ස්ථාපනය කොට පවත්වාගෙන යාමට නිර්දේශ කර ඇත.<br><br>• ආර්ථික මධ්‍යස්ථාන ගොඩනැගීම සඳහා රජය එවකට රු.මි. 879 කට අධික පිරිවැයක් දරා ඇත.<br><br>• දැනට පවතින කළමනාකාරීත්වයේ බොහෝ දුර්වලතා නිරීක්ෂණය වන අතර මෙම ආර්ථික මධ්‍යස්ථානවලට අයත් වත්කම් නිසි පරිදි තක්සේරු කළ යුතුව ද ඇත.<br><br>විෂයභාර අමාත්‍යාංශ නිලධාරීන් සහ අනෙකුත් අදාළ නිලධාරීන් සමඟ මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී 2025.01.06 දින පැවති සාකච්ඡාවේ දී සහ තොරතුරු විශ්ලේෂණයේ දී පහත කරුණු නිරීක්ෂණය විය.<br><br>• මේ වන විට ආර්ථික මධ්‍යස්ථාන 14 ක් ක්‍රියාකාරීත්වයේ පවතී. එසේම සමහර ආර්ථික මධ්‍යස්ථානවල විශාල වශයෙන් ගබඩා පහසුකම් ස්ථාපනය කොට ඇත. ඒ අනුව ආර්ථික මධ්‍යස්ථාන අතර අන්තර් සම්බන්ධතාවයක් පැවතිය යුතු වේ.<br><br>• ඇතැම් ආර්ථික මධ්‍යස්ථානවල විශාල වශයෙන් අරමුදල් පවතින නමුදු, සමහර ආර්ථික මධ්‍යස්ථානවල අරමුදල්වල ඌණතාවයන් පවතින බැවින් 2024 | <u>ක්‍රියා කිරීම</u><br><br>1. ලේකම්, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය<br><br>සියලුම භාර අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කිරීම සඳහාත් සියලුම ආර්ථික මධ්‍යස්ථාන සඳහා එක් අරමුදලක් පවත්වාගෙන යාමට හා ශක්තිමත් මධ්‍යගත පාලන ක්‍රමවේදයක් සකස් කිරීමට අදාල විධිවිධාන මෙම අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත්කර ගැනීම සඳහා සකස් කරනු ලබන පනතට ඇතුළත් කිරීම. |

| | | |
|---|---|---|
| **9.**කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>**10.**නුවරඑළිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>**11.**කෘෂි අපනයන භෝග විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල (කුරුදුවත්ත)<br><br>**12.**කන්දහංදිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>**13.**තඹුත්තේගම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>**14.** අම්පාර විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ භාර අරමුදල<br><br>• වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශයේ අ/ම/ප/05/2119/027/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි එක් එක් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන සඳහා කළමනාකරණ අරමුදල් භාරය නමින් අරමුදල් පිහිටුවා ඇත. | වර්ෂයේදී රු.මි.50 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන සලසා ගෙන ඇත.<br><br>• මෙම ආර්ථික මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු වඩාත් ඵලදායීවත් සහ කාර්යක්ෂමවත් ඉටු කිරීම සඳහාත් සියලුම භාර අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කිරීම සඳහාත් සියලුම ආර්ථික මධ්‍යස්ථාන සඳහා එක් අරමුදලක් පවත්වාගෙන යාමට හා ශක්තිමත් මධ්‍යගත පාලන ක්‍රමවේදයක් සකස් කිරීමට අදාල විධිවිධාන, මෙම අරමුදල් ව්‍යවස්ථාපිත තත්ත්වයට පත්කර ගැනීම සඳහා සකස් කරනු ලබන පනතට ඇතුළත් කළ යුතු වීම. | |

## 6.4 රජයේ නොවන අරමුදල්

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර කෙටියෙන් | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| **1.හජ් අරමුදල**<br><br>මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br>බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 88.8කි. | බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති අංක MBRCA/03/13/39/2024 හා 2025.03.07 දිනැති ලිපිය සමඟ ඉදිරිපත් කර ඇති වාර්තාවේ සඳහන් කරුණු<br>• හජ් වන්දනාකරුවන්ට අවශ්‍ය සහාය දැක්වීමටත් සුභසාධන පහසුකම් සැපයීමටත් සෞදි අරාබියේ හජ් අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය සිදු කිරීමටත් මෙම හජ් අරමුදල අත්‍යාවශ්‍ය බව.<br>• හජ් වන්දනා සඳහා සංවිධායකවරුන් විසින් ලබාදෙන ආධාර, හජ් අරමුදල සඳහා ප්‍රතිපාදන ලැබෙන ප්‍රධාන ක්‍රමවේදය වේ.<br>• මෙම අරමුදලේ ආදායම් මූලාශ්‍ර වනුයේ හජ් වන්දනා සඳහා සංවිධායක වරුන් ලබාදෙන ආධාර වන නිසාත්, රජයේ අරමුදල් ආදායම් මූලාශ්‍රයක් නොවන නිසාත් මෙය සෘජුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන අරමුදලක් නොවන බව පෙනී යයි.<br>• බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් බවට පත් කර ගැනීම අවශ්‍ය බවට නිර්දේශ කර ඉදිරිපත් කර ඇති අතර මේ වනවිට මෙම අරමුදල ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරගෙන යන බව දන්වා ඇත. | <u>ක්‍රියා කිරීම:</u><br><br>1. ලේකම්, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය<br><br>2. අධ්‍යක්ෂ ජනරාල් - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව<br><br>මෙම අරමුදල රජයේ අරමුදල්වලට අයත් නොවන අරමුදලක් ලෙස හඳුනා ගත්තද බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පනතක් සකස් කරමින් සිටින බව දැනුම් දුන් බැවින් හා ඒ අනුව අරමුදලේ කටයුතු තවදුරටත් විධිමත් වන බැවින් එම පනතේ කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව ඉදිරි පියවර ගැනීම සුදුසු වේ. |
| **2.සේවක සුභසාධක හා සකසුරුවම් අරමුදල (Employee Welfare and Thrift Fund)**<br>ජාතික ලොතරැයි මණ්ඩලය, මුදල්, ක්‍රම සම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | • අලෙවි කරනු ලබන සෑම ලොතරැයියකින්ම ශත එකක් බැගින් වූ මුදලක් මෙම අරමුදල වෙත බැර කරන අතර 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.60.9 ක් බව 2025.03.27 දින පැවති රැස්වීමේදී අදාළ ආයතනය නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් දැනුම් දී ඇත. | <u>ක්‍රියා කිරීම -</u><br>1. අතිරේක ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br>2. සභාපති, ජාතික ලොතරැයි මණ්ඩලය |

| | | |
|---|---|---|
| • ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ සුබසාධන කටයුතු වෙනුවෙන් සේවකයින්ගේ හා මණ්ඩලයේ දායකත්වයෙන් පවත්වාගෙන යන අරමුදලකි.<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 60.9කි. | • සුබසාධන අරමුදලක් යනුවෙන් සේවකයින්ගේ දායකත්වයෙන් සමන්විත අරමුදලක් අදහස් කෙරෙන අතර ඒ සඳහා රජයේ අරමුදල් බැර කිරීම සිදු නොකළ යුතුය.<br><br>• 2024 අංක 44 දරන රාජ්‍ය මුදල් කළමනාකරණ පනතේ ව්‍යවස්ථාපිත අරමුදල් යන්නට දක්වා ඇති අර්ථ නිරූපණය අනුව සුභසාධන අරමුදල්, "ව්‍යවස්ථාපිත අරමුදල්" යටතට අයත් නොවන නමුත්, ඒ සඳහා රජයට බැර විය යුතු මුදලක් සපයන්නේ නම්, එය රජයේ අරමුදල් යටතට ගැනෙන බැවින් ව්‍යවස්ථාපිත තත්වයට පත් කොට පවත්වාගෙන යා යුතු වේ.<br><br>• කෙසේ වුවද, මෙම අරමුදල රජයේ නොවන අරමුදලක් ලෙස පවත්වාගෙන යාමට කටයුතු කරන්නේ නම් මෙතෙක් මෙම අරමුදල සඳහා බැර කර ඇති මණ්ඩලයේ මුදල් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු අතර, එහිදී මින් ඉදිරියට මෙම අරමුදල සඳහා මණ්ඩලයේ මුදල් බැර නොකරන බවත්, මේ දක්වා බැර කර ඇති මුදලට පමණක් අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරනු ලබන බවටත් පැහැදිලිව දන්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කළ යුතු වේ. | ජාතික ලොතරැයි මණ්ඩලයේ අරමුදල් බැර කිරීමකින් තොරව මෙම අරමුදල ඉදිරියේදී රජයේ නොවන අරමුදලක් (Non-Public Fund) ලෙස පවත්වාගෙන යාම සහ ඒ අනුව මේ දක්වා අරමුදල වෙත බැර කරන ලද මණ්ඩලයේ දායක මුදල් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම. |
| **3.සේවක සුභසාධක සංගමය (Welfare Society)**<br><br>**ජාතික ලොතරැයි මණ්ඩලය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>• මණ්ඩලීය සේවකයන්ගේ මාසික දායකත්වයෙන් සේවකයන්ගේ සුභසිද්ධිය උදෙසා සුභසාධක කටයුතු සිදු කිරීම වෙනුවෙන් මෙම අරමුදල පිහිටුවා ඇත. | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව මෙම අරමුදල, රජයේ නොවන අරමුදලක් (Non-Public Fund) ලෙසට හඳුනාගෙන ඇත.<br><br>2025.03.27 හා 2025.05.20 දිනවල පැවති රැස්වීම්වලදී ඉදිරිපත් වූ වෙනත් කරුණු<br>• මෙම සුභසාධක සංගමයට අදාළ ගිණුම් ප්‍රකාශන පරීක්ෂා කිරීමේ දී, මණ්ඩලයේ සේවකයන් වෙත මණ්ඩලය විසින් ගෙවනු ලබන විවිධ දීමනා, මෙම සුබ සාධක සංගමයට ලැබීම ලෙස සටහන් කොට නැවතත් සුභසාධක සංගමයේ ගෙවීමක් | <u>ක්‍රියා කිරීම -</u><br>**1. අතිරේක ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>**2. සභාපති, ජාතික ලොතරැයි මණ්ඩලය**<br><br>මෙම අරමුදල සේවකයන්ගේ මාසික දායකත්වයෙන් සේවකයින්ගේ සුභසිද්ධිය උදෙසා සුභසාධන කටයුතු සිදු කිරීම වෙනුවෙන් පිහිටුවා ඇති අරමුදලක් බැවින්, රජයේ නොවන අරමුදලක් (Non- |

| | | |
|---|---|---|
| • 2024.12.31 දිනට මෙම අරමුදල් ගිණුමේ ශේෂය රු.මි. 6.2 කි. | ලෙස ගෙවීම් කර ඇති බව නිරීක්ෂණය වේ.<br>• කෙසේ වුවද, මේ වන විට මෙම සුභ සාධක සංගමයේ ගිණුම හරහා එම කටයුතු සිදු කිරීම නවතා ඇති බව ජාතික ලොතරැයි මණ්ඩලයේ නිලධාරීන් විසින් ප්‍රකාශ කරන ලදී.<br>• 2024 අංක 44 දරන රාජ්‍ය මුදල් කළමනාකරණ පනතේ ව්‍යවස්ථාපිත අරමුදල් යන්නට දක්වා ඇති අර්ථ නිරූපණය අනුව "ව්‍යවස්ථාපිත අරමුදල්" යටතට අයත් නොවන රජයේ නොවන අරමුදලක් (Non-Public Fund) ලෙසට හඳුනා ගැනීමට තීරණය විය. | Public Fund) ලෙසට හඳුනා ගන්නා ලදී. |
| **4. සෙවණ සරණ මාපිය යෝජනා ක්‍රමය ("අත්වැල" අනුග්‍රාහක යෝජනා ක්‍රමය )**<br><br>පරිවාස සහ ළමාරක්ෂක දෙපාර්තමේන්තුව<br><br>කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>• 2021 වසරේ සිට "අත්වැල අනුග්‍රාහක මාපිය යෝජනා ක්‍රමය" ලෙස හැඳින්වේ. | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව මෙම අරමුදල, රජයේ නොවන අරමුදලක් (Non-Public Fund) ලෙසට හඳුනාගෙන ඇත.<br>• මෙය වෙනම අරමුදලක් නොවන අතර එහි මුදල් ලැබීම් සහ ගෙවීම් 6000-0-0-6-0-079-0 යන තැන්පත් ගිණුම යටතේ වාර්තා කරන අතර එක් එක් වර්ෂය අවසානයේ මුදල් ශේෂය භාණ්ඩාගාරයට පියවනු ලැබේ.<br>• මෙම අරමුදල සතු එකම වත්කම වනුයේ අනුග්‍රාහක මව හෝ පියා විසින් ලබා දෙන ප්‍රදාන මුදල්, තෝරාගත් ආධාර අවශ්‍ය දරුවන්ගේ ගිණුම්වලට තැන්පත් කරන තුරු රඳවා ගැනීම නිසා පවතින මුදල් වත්කම පමණි.<br>• ඒ අනුව, මෙය රාජ්‍ය නොවන අරමුදලක් (Non Public Fund) ලෙසට හඳුනා ගන්නා ලදී. | <u>**ක්‍රියා කිරීම -**</u><br>**1.ලේකම්,**<br>කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය<br><br>**2. කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**<br><br>මෙම අරමුදල රාජ්‍ය නොවන අරමුදලක් (Non Public Fund) ලෙසට හඳුනා ගැනීම. |
| **5. සේවක ආපදා ණය අරමුදල**<br><br>ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව<br><br>විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය | මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාවේ නිලධාරීන් සමඟ 2025.02.14 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති අරමුදල් සමාලෝචන රැස්වීමේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් වී ඇත. | <u>**ක්‍රියා කිරීම**</u><br>**1. ලේකම්, විද්‍යා හා තාක්ෂණ** අමාත්‍යාංශය<br><br>**2. සභාපති, ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව**<br>i) 2025.02.10 දිනැති රජයට අයත් වාණිජමය නොවන |

| | | |
|---|---|---|
| • වාර්ෂිකව ආපදා ණය ගෙවීම සඳහා අයවැය හරහා ප්‍රතිපාදන වෙන් නොවෙන බැවින්, මෙම අරමුදලේ මුදල් ඒ සඳහා යොදා ගනී.<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 2.4 කි. | • මෙම අරමුදලේ මූලික ප්‍රාග්ධනය ලෙස සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව භාවිතා කර ඇත. තවද, අරමුදලේ වර්තමාන ලැබීම් මූලාශ්‍ර වන්නේ ආපදා ණය වාරික ලැබීම් සහ ණය වාරික පොළිය වේ.<br>• 2025.02.10 දිනැති රජයට අයත් වාණිජමය නොවන ආයතනයන් පිළිබඳ සමාලෝචන කමිටු වාර්තාවට අනුව ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව ජාතික මට්ටමේ නව පර්යේෂණ ආයතනයක් පිහිටුවීම සඳහා ඒකාබද්ධ කළ යුතු ආයතන ලෙස හඳුනාගෙන ඇත. මෙහිදී එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළ විශේෂ පර්යේෂණ ඒකක ඇතුළත්ව වන පරිදි ආයතන ව්‍යුහය සැළසුම් කිරීම නිර්දේශ කර ඇත. | ආයතනයන් පිළිබඳ සමාලෝචන කමිටු වාර්තාවේ නිර්දේශ සැළකිල්ලට ගත යුතු වීම.<br><br>ii.) මෙම අරමුදලේ දැනට පවතින ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමටත්, එසේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන මුදලට සමාන මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානයක් ලෙස මෙම ආයතනයට ලබා දීමටත් කටයුතු කල යුතුය. ඉන් අනතුරුව, රජයේ ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ආදායම් මෙම අරමුදලට බැර නොකල යුතු අතර, ඉදිරියේදී රජයේ නොවන අරමුදලක් (Non Public Fund) ලෙස පවත්වාගෙන යාමට කටයුතු කිරීම. |
| **6. ස්වයං මූල්‍යයන අරමුදල (Earned Fund Account)**<br><br>**ජාතික විද්‍යා පදනම**<br><br>**විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය**<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 7.8 කි. | මේ සම්බන්ධයෙන් ජාතික විද්‍යා පදනම නිලධාරීන් සමඟ 2025.02.14 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති අරමුදල් සමාලෝචන රැස්වීමේදී පහත සඳහන් කරුණු ඉදිරිපත් වී ඇත.<br>• බාහිර ආයතන සමඟ ව්‍යාපෘති කිරීමේදී ලැබෙන පරිපාලන වියදම් නිලධාරීන්ට නොගෙවා මෙම අරමුදලට බැර කිරීම සිදු කරයි.<br>• උපදේශන ගාස්තු ලෙස ලැබෙන මුදල් මෙම අරමුදලට බැර කෙරේ.<br>• වාර්ෂිකව ආපදා ණය ගෙවීම සඳහා අයවැය හරහා ප්‍රතිපාදන වෙන් නොවෙන බැවින්, මෙම අරමුදලේ මුදල් ඒ සඳහා යොදා ගනී. අවුරුද්ද අවසානයේ අරමුදලේ ඇති ශේෂය අනුව දිරි දීමනාවක් ගෙවීම සිදුකෙරේ. | **ක්‍රියා කිරීම**<br>**1. ලේකම්, විද්‍යා සහ තාක්ෂණ අමාත්‍යාංශය**<br><br>**2. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික විද්‍යා පදනම**<br><br>i.) 2025.02.10 දිනැති රජයට අයත් වාණිජමය නොවන ආයතනයන් පිළිබඳ සමාලෝචන කමිටු වාර්තාවේ නිර්දේශ සැළකිල්ලට ගත යුතු වීම.<br>ii.) මෙම අරමුදලේ දැනට පවතින ශේෂය ඒකාබද්ධ අරමුදලට බැර කිරීමටත්, එසේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබන මුදලට සමාන මුදලක් ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් |

| | | |
|---|---|---|
| | • 2025.02.10 දිනැති රජයට අයත් වාණිජමය නොවන ආයතනයන් පිළිබඳ සමාලෝචන කමිටු වාර්තාවට අනුව ජාතික විද්‍යා පදනම ජාතික මට්ටමේ නව පර්යේෂණ ආයතනයක් පිහිටුවීම සඳහා ඒකාබද්ධ කළ යුතු ආයතන ලෙස හඳුනාගෙන ඇත. මෙහිදී එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළ විශේෂ පර්යේෂණ ඒකක ඇතුළත්වන පරිදි ආයතන ව්‍යුහය සැලසුම් කිරීම නිර්දේශ කර ඇත. | ප්‍රදානයක් ලෙස මෙම ආයතනයට ලබා දීමටත් කටයුතු කල යුතුය. ඉන් අනතුරුව, රජයේ ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ආදායම් මෙම අරමුදලට බැර නොකල යුතු අතර, ඉදිරියේදී රජයේ නොවන අරමුදලක් (Non Public Fund) ලෙස පවත්වාගෙන යාමට කටයුතු කිරීම. |

## 6.5 නීතිපති විමසා ඉදිරි කටයුතු කළ යුතු අරමුදල්

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර කෙටියෙන් | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| **1.අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති අරමුදල් සහ ඒවා යටතේ ඇති විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපනය ආයතනවල ඇති අරමුදල්**<br><br>• 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සංඛ්‍යාව 21 කි. (ඇමුණුම 15) | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන විසින් පවත්වා ගෙන යනු ලබන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් 21 ක් වාර්තාකර තිබුණ ද ඒවා රාජ්‍ය නොවන අරමුදල් ලෙස හඳුනාගෙන තිබුණි.( ඇමුණුම 15)<br><br>• 2017 වර්ෂයේදී ස්ථාපිත අරමුදල් සමාලෝචන කමිටුව විසින් හඳුනාගෙන ඇති අරමුදල්වලට අමතරව මෙතෙක් වාර්තා වී නොමැති අරමුදල් බොහෝ ප්‍රමාණයක් විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන යටතේ පැවතිය හැක.<br><br>• 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරන පනතේ විධිවිධාන පරිදි ව්‍යවස්ථාපිත නොවන අරමුදල් තවදුරටත් පවත්වාගෙන යාමේ හැකියාවක් නොමැත.<br><br>ඒ අනුව, උක්ත ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් නිසි පරිදි ව්‍යවස්ථාපිත හෝ ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ලෙස හඳුනා ගතයුතු වේ. | <u>ක්‍රියා කිරීම</u><br>**1. ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**<br><br>i.) අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති විශ්ව විද්‍යාල සහ උසස් අධ්‍යාපනය ආයතනවල පිහිටුවා ඇති විවිධ වූ උප අරමුදල් එම ආයතන ස්ථාපනය කර ඇති නෛතික විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාපිත ද, නොඑසේ නම් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ද යන්න සම්බන්ධයෙන් නිගමනයක් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විමසා මෙම ගැටළුව නොපමාව විසඳා ගැනිමට කටයුතු කිරීම.<br>ii.) ඒ අනුව ගත් ක්‍රියාමාර්ග අරමුදල් සමාලෝචනය කමිටුවට වාර්තා කිරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට නොපමාව වාර්තා කිරීම. |

| | | |
|---|---|---|
| | • ඒ අනුව ව්‍යවස්ථාපිත තත්ත්වයට පත් කළ යුතු යැයි හැඟෙන අරමුදල් සම්බන්ධයෙන් 2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 පරිදි කටයුතු කරන ලෙසත්, වසා දැමිය හැකි අරමුදල් වසා දැමීමටත්, එකම අරමුණ සඳහා පවත්වාගෙන යන අරමුදල් ඒකාබද්ධ කර පවත්වාගෙන යාම පිළිබඳවත් අවධානය යොමු කරන ලෙසත් මෙම ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් අධීක්ෂණය සඳහා යෝග්‍ය ක්‍රමවේද සකස් කරන ලෙසත්, මීට පෙර මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී පැවති රැස්වීම්වලදී අදාළ ආයතනවල නිලධාරීන් දැනුවත් කර ඇත.<br><br>• 2025/03/03 දින පැවති සාකච්ඡාවේදී, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 99 වගන්තියේ සඳහන් විශ්ව විද්‍යාල අරමුදල (Universities Fund) යන විධිවිධානය යටතේ සහ එම පනතේ 101 වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල් ස්ථාපිත කර ඇති බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නියෝජනය කරමින් පැමිණි නිලධාරීන් ප්‍රකාශ කළ ද එම විධිවිධානය යටතේ විවිධ වූ උප අරමුදල් පිහිටුවා ඇති බැවින් ඒවායේ ව්‍යවස්ථාපිත තත්ත්වය පිළිබඳ නෛතික ගැටලුවක් පවතින බව පෙනී යයි.<br><br>• අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති අරමුදල් සහ ඒවා යටතේ ඇති විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපනය ආයතනවල ඇති අරමුදල් හා විශේෂයෙන්ම එම ආයතන යටතේ ස්ථාපනය කර ඇති උප අරමුදල් එම ආයතන ස්ථාපනය කර ඇති නෛතික විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාපිත ද නොඑසේ නම් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ද යන්න සම්බන්ධයෙන් නිගමනයක් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විමසා මෙම ගැටළුව විසඳා ගත යුතුව ඇත. | iii.) ඒ අනුව හඳුනාගනු ලබන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් 2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 සහ ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් 2025.02.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2025 පරිදි කටයුතු කිරීම.<br><br>iv.) වසා දැමිය හැකි අරමුදල් වසා දැමීමටත් එකම අරමුණ සඳහා පවත්වාගෙන යන අරමුදල් ඒකාබද්ධකර පවත්වාගෙන යාම පිළිබඳවත් අවධානය යොමු කොට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| **2.ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යනු ලබන අරමුදල් (5)**<br><br>**1. සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල**<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු. මි. 119 කි.<br><br>**2. සමෘද්ධි අරමුදල**<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු. මි. 2,924.3 කි.<br><br>**3. සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල**<br>• 2024.12.31 දින මෙම අරමුදලේ ශේෂය රු. මි. 2,778.37කි<br><br>**4. ජීවනෝපාය සංවර්ධන චක්‍රීය අරමුදල**<br>• 2024.12.31 දින මෙම අරමුදලේ ශේෂය රු. මි. 3565 කි.<br><br>**5. සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල**<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු. මි.15,019.62 කි | • මෙම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල් සම්බන්ධයෙන් 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, කමිටුව විසින් පහත සඳහන් නිර්දේශ ලබා දී ඇත.<br>• සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල හා සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල සඳහා පාර්ලිමේන්තුවේ නිසි අනුමැතියකින් තොරව සමෘද්ධි දීමනාවෙන් කොටසක් අයකර ගැනීමේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ගැටළු සහගත බැවින්, මෙම අරමුදල්වල අරමුණු සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කළ යුතු වීම.<br>• සමෘද්ධි අරමුදල හා ජීවනෝපාය සංවර්ධන චක්‍රීය අරමුදල යන අරමුදල් ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු කිරීම.<br>• සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ කාර්යයන් සිදු කිරීමට පැවරී ඇති වෙනත් රජයේ ආයතන ඇති බැවින්, මෙම අරමුදල වසා දමා අරමුදලේ කාර්යයන් වෙනත් අරමුදලක් සමග ඒකාබද්ධ කිරීම සුදුසු බව.<br><br>තවදුරටත් මෙම අරමුදල් සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීමේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ.<br><br>• ජීවනෝපාය සංවර්ධන චක්‍රීය අරමුදල සමෘද්ධි බැංකු හරහා ක්‍රියාත්මක කරන අනෙකුත් ණය වැඩසටහන් ක්‍රියාත්මක කරන ආකාරයට පවත්වාගෙන යාම සුදුසු බැවින් අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බවත් නිරීක්ෂණය වේ.<br><br>• සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ කාර්යයන් අයවැය ප්‍රතිපාදන මගින් සිදු කළ හැකි බැවින් අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති බව නිරීක්ෂණය වේ. | **ක්‍රියා කිරීම:**<br>**1. ලේකම් , ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය**<br><br>**2. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**<br><br>i). සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් හා එම ආයතන ස්ථාපනය කර ඇති නෛතික විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාපිතද නොඑසේ නම් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ද යන්න සම්බන්ධයෙන් නිගමනයක් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විමසා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වෙත වාර්තා කිරීම.<br>ii). ඒ අනුව, මෙම අරමුදල් හා අරමුදල්වල ශේෂයන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම.<br>iii) තවදුරටත් හඳුනාගනු ලබන ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සම්බන්ධයෙන් 2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 සහ ව්‍යවස්ථාපිත අරමුදල් සම්බන්ධයෙන් 2025.02.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2025 පරිදි කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | • සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල හා සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල යන අරමුදල් සඳහා සමෘද්ධි දිමනාව වෙනුවට අස්වැසුම සුභසාධන වැඩසටහන ක්‍රියාත්මක වීම හේතුවෙන් ලැබීම් ප්‍රභවයක් නොමැති අතර, මෙතෙක් සිදු කළ අයකිරීම්වල නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් ද ගැටලුවක් පවතී.<br><br>• තවද, සමෘද්ධි දිමනාව වෙනුවට අස්වැසුම සුභසාධන වැඩසටහන ක්‍රියාත්මක වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අවශ්‍ය ප්‍රතිපාදන වාර්ෂික අයවැයෙන් ලබා දීම හා අරමුදලේ ව්‍යවස්ථාපිතභාවය සම්බන්ධයෙන් පවතින ගැටළු හේතුවෙන් සමෘද්ධි වැඩසටහන යටතේ ආරම්භ කරන ලද සමෘද්ධි අරමුදල තවදුරටත් පවත්වාගෙන යාමේ හැකියාව සම්බන්ධයෙන් ද, 2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වගන්තිය අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යන අරමුදල් අවසන් කිරීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් පවතින බවත් නිරීක්ෂණය වේ.<br><br>• ඒ අනුව, මෙම අරමුදල් හා අරමුදල්වල ශේෂයන් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සුදුසු බවත්, මෙම අරමුදල් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් හා එම ආයතන ස්ථාපනය කර ඇති නෛතික විධිවිධාන ප්‍රකාරව ව්‍යවස්ථාපිත ද, නොඑසේ නම් ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ද යන්න සම්බන්ධයෙන් නිගමනයක් නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් විමසා ඉදිරි කටයුතු කළ යුතු බවත් නිරීක්ෂණය වේ. | |

| | | |
|---|---|---|
| **3.පියවීම් සහතික කිරීමේ අරමුදල (Settlement Guarantee Fund (SGF))**<br><br>**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>• 1998.05.22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුව යටතේ මහා භාණ්ඩාගාරය විසින් සපයන ලද රු. මි. 50 ක සහ කොළඹ කොටස් වෙළඳපළ විසින් සපයන ලද රු.මි. 100 ක මුදල ආරම්භක ප්‍රාග්ධනය ලෙස යොදවා මෙම අරමුදල පිහිටුවා ඇත. දැනට මෙම අරමුදලේ ශේෂය රු.මි.1,366 කි. | • මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යා යුතු බවට 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව මගින් නිර්දේශ කර ඇත.<br><br>• කොළඹ කොටස් වෙළඳපොළ අවසානාත්මක හා තීරණාත්මකභාවය ස්ථාපිත කිරීම උදෙසා නිෂ්කාශනාගාරයක් පිහිටුවන තෙක් මෙම භාර අරමුදල පිහිටුවා ඇත.<br><br>• කොළඹ කොටස් වෙළඳපළ විසින් අදාළ නිෂ්කාශනාගාරය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලබන අතර, එම කටයුතු 2025 වසරේ අගෝස්තු මාසය වන විට අවසන් වීමට නියමිතව ඇති අතර, ඒ අනුව මෙම අරමුදල ඈවර කිරීම සම්බන්ධයෙන් නීතිපති උපදෙස් විමසා ඇති අතර එම උපදෙස් ලැබුණු පසු අරමුදල සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු වේ.<br><br>• කෙසේවුවද, මෙම අරමුදල සම්බන්ධයෙන් අරමුදල් කළමනාකරණ මණ්ඩලයක් පත් කිරීම හෝ මීට අදාළ නෛතික විධිවිධාන ඇතුළත් නීති මාලාවක් ප්‍රකාශ කිරීම මේ දක්වා සිදුකර නොමැත. | <u>ක්‍රියා කිරීම</u><br><br>1. අතිරේක ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය<br><br>2. සභාපති, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව<br>i) කොළඹ කොටස් වෙළඳපොළ විසින් අදාළ නිෂ්කාශනාගාරය ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන තෙක් මෙම අරමුදල තවදුරටත් පවත්වාගෙන යාම හා මීට අදාළව නෛතික විධිවිධාන ඇතුළත් නීතිමාලාවක් ප්‍රකාශයට පත් කිරීම.<br><br>ii) කොළඹ කොටස් වෙළඳපළ විසින් අදාළ නිෂ්කාශනාගාරය පිහිට වූ පසු නීතිපති උපදෙස් ප්‍රකාරව අරමුදල ඈවර කිරීමට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම. |

6.6 රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි වසා දැමීමට සුදුසු බවට එකඟ වූ ව්‍යවස්ථාපිත අරමුදල්

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| 1. පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල<br><br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br><br>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>• පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල, 1974 අංක 16 දරණ පළාත් පාලන සේවා පනතේ 16 අ (1) වගන්තිය මඟින් පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹුවන්ට හා අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. | • රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ 2025.01.16 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී අදාළ අරමුදල නියෝජනය කිරීමට පැමිණ සිටි නිලධාරීන් විසින් 1990 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් වුවද, මේ වන විට ලැබීම් හෝ ගෙවීම් කිසිවක් සිදු කරනු ලබන සක්‍රිය අරමුදලක් නොවන බවත්, අරමුදල වසා දැමීමට හැකියාවක් ඇති බවත් ප්‍රකාශ කරන ලද අතර ඒවා වසා දැමීම සඳහා ඇවර කිරීමේ ක්‍රියා පටිපාටියක් පිළිබඳව උපදෙසක් ලබා දෙන ලෙසත් ඉල්ලා ඇත.<br><br>• 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනුයේ රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් අරමුදල පමණක් වන අතර අනෙකුත් සියලු විශ්‍රාම වැටුප් අරමුදල් වසා දැමීමේ අවසන් අදියරේ පවතින බැවින් ඒවායේ සියලු කටයුතු රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් අරමුදලට අන්තර්ගත කර මෙම අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතු බවට නිර්දේශ කර ඇත . | <u>ක්‍රියා කිරීම:</u><br>1. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>2. අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br><br>පනත සංශෝධනය කොට අරමුදල වසා දැමීම. |
| 2. පළාත් පාලන සේවා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල<br><br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br><br>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | • රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ 2025.01.16 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී අදාළ අරමුදල නියෝජනය කිරීමට පැමිණ සිටි නිලධාරීන් විසින් 1990 වර්ෂයේ සිට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක කරන මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් වුවද, මේ වන විට ලැබීම් හෝ ගෙවීම් කිසිවක් සිදු කරනු ලබන සක්‍රිය | <u>ක්‍රියා කිරීම</u><br>1. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br>2. අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br><br>පනත සංශෝධනය කොට අරමුදල වසා දැමීම. |

| | | |
|---|---|---|
| • 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ 16 අ (1) වගන්තිය හා 1985 අංක 10 දරන පළාත් පාලන සේවා (සංශෝධිත) පනතේ වගන්ති අංක 14 මගින් පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ගේ වැන්දඹු පුරුෂයන්ට හා අනත්දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මෙම වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවා ඇත. | අරමුදලක් නොවන බවත්, අරමුදල වසා දැමීමට හැකියාවක් ඇති බවත් ප්‍රකාශ කරන ලද අතර ඒවා වසා දැමීම සඳහා ඇවර කිරීමේ ක්‍රියා පටිපාටියක් පිළිබඳව උපදෙසක් ලබා දෙන ලෙසත් ඉල්ලා ඇත.<br><br>• 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනුයේ රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් අරමුදල පමණක් වන අතර අනෙකුත් සියලු විශ්‍රාම වැටුප් අරමුදල් වසා දැමීමේ අවසන් අදියරේ පවතින බැවින් ඒවායේ සියලු කටයුතු රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් අරමුදලට අන්තර්ගත කර මෙම අරමුදල වසා දැමීමට කටයුතු කළ යුතු බවට නිර්දේශ කර ඇත. | |
| 3. පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල<br><br>විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව<br><br>රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය<br><br>• 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් පනත නැවත 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනතේ විධිවිධාන අනුව බලාත්මක කරමින් පවත්වාගෙන යනු ලබන බවත්, 1993 පළාත් සභා පිහිටුවීමට පෙර පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයින්ට විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා මෙම විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවා ඇත. | • රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය නිලධාරීන් සමග 2025.01.16 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී අදාළ අරමුදල නියෝජනය කිරීමට පැමිණ සිටි නිලධාරීන් විසින් මෙම අරමුදලේ 2024-11-30 දිනට රු. බිලියන 1කට ආසන්න ශේෂයක් පවතින බවත් ආයෝජන සඳහා යොදවා නැති බවත් ප්‍රකාශ කරන ලදි. මෙහිදී විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා ගෙවීම ඒකාබද්ධ අරමුදල හරහා ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන මත සිදුකරන බැවින් සැබෑ ලෙස අරමුදලක අවශ්‍යතාවයක් නොමැති බව අවධාරණය විය.<br><br>• 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක තත්ත්වයේ පවතිනුයේ රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් අරමුදල පමණක් වන අතර අනෙකුත් සියලු විශ්‍රාම වැටුප් අරමුදල් වසා දැමීමේ අවසන් අදියරේ පවතින බැවින් ඒවායේ සියලු කටයුතු රාජ්‍ය සේවා විශ්‍රාම වැටුප් අරමුදලට අන්තර්ගත කර අරමුදල් වසා දැමීම කළ යුතු බවට නිර්දේශ කර ඇත. | <u>ක්‍රියා කිරීම</u><br>**1. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**<br><br>**2. අධ්‍යක්ෂ ජනරාල්, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**<br><br>i.) පනත සංශෝධනය කොට අරමුදල වසා දැමීම.<br><br>ii.) අරමුදලේ ශේෂය ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම. |

6.7 දැනට අරමුදල් ලෙස හඳුනාගෙන ඇති නමුත් තවදුරටත් අරමුදල් කාණ්ඩයට අයත් නොවන ගිණුම් ශේෂ

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර කෙටියෙන් | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| 1.වෛද්‍ය රක්ෂණාවරණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කිරීම **(Medical Fund)**<br><br>**ජාතික ලොතරැයි මණ්ඩලය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>• මෙය අරමුදලක් නොවන අතර මණ්ඩලයේ වාර්ෂික අයවැයෙන් වෙන් කරනු ලබන ප්‍රතිපාදන යටතේ සේවක වෛද්‍ය රක්ෂණ ප්‍රතිලාභ ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රමවේදයකි. | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව මෙම අරමුදල, රජයේ නොවන අරමුදලක් (Non-Public Fund) ලෙසට හඳුනාගෙන ඇත.<br><br>• ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවක මහත්ම මහත්මීන්ගේ සුභසාධනය වෙනුවෙන් මණ්ඩලයේ දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන සේවක ප්‍රතිලාභ ක්‍රමයක් බව නිරීක්ෂණය වේ.<br><br>• ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 අනුව විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව, රජයේ අරමුදල් භාවිතා කරමින් රක්ෂණ ක්‍රම, සහන ණය යෝජනා ක්‍රම, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වැනි වැඩසටහන් ක්‍රියාත්මක නොකළ යුතුය.<br><br>• මෙය අරමුදලක් නොවන අතර, ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික අයවැය ලේඛනය යටතේ ක්‍රියාත්මක කරන වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ ක්‍රමවේදයක් පමණි. | <u>ක්‍රියා කිරීම</u><br>**1. අතිරේක ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br>**2. සභාපති, ජාතික ලොතරැයි මණ්ඩලය**<br>මෙය අරමුදලක් ලෙස නොව ජාතික ලොතරැයි මණ්ඩලයේ වාර්ෂික අයවැය ලේඛනය යටතේ ක්‍රියාත්මක කරන වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ ක්‍රමවේදයක් ලෙස හඳුනා ගන්නා ලද අතර නිසි ක්‍රමවේද අනුගමනය කරමින් සහ නිසි අනුමැතින්ට යටත්ව වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ කටයුතු මණ්ඩලයේ වාර්ෂික අයවැය හරහා සිදු කිරීම කළ යුතුවේ. |
| **2.අලෙවි නියෝජිත ඇප මුදල් සඳහා තැන්පතුව**<br><br>**සංවර්ධන ලොතරැයි මණ්ඩලය**<br><br>**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.90කි | • සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අලෙවි නියෝජිතයකු බඳවා ගැනීමේදී ඔවුන්ගේ පත්වීම් ලිපිය අනුව ගෙවිය යුතු ඇප තැන්පතුවක් වන අතර, අලෙවි නියෝජිතවරයා තම අලෙවි නියෝජිත ධුරයෙන් ඉවත්ව යන විට විට මෙම තැන්පතුව ආපසු ලබාදීමට මණ්ඩලය බැඳී සිටී.<br><br>• එබැවින්, මෙය බාහිර පාර්ශවයක් වෙත නැවත ගෙවිය යුතු තැන්පතුවක් වේ. | <u>ක්‍රියා කිරීම</u><br>**1. අතිරේක ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br>**2. සභාපති, සංවර්ධන ලොතරැයි මණ්ඩලය**<br><br>අරමුදලක් නොව තෙවන පාර්ශවයන් වෙත ගෙවිය යුතු වගකීම් හා අදාල තැන්පතුවක් පමණි. |

| | | |
|---|---|---|
| 3.පාරිතෝෂිත අරමුදල **(Gratuity Fund)**<br><br>ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව<br><br>මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව මෙම අරමුදල, රජයේ නොවන අරමුදලක් (Non-Public Fund) ලෙසට හඳුනාගෙන ඇත.<br><br>• තවද, මෙය සේවකයන් වෙනුවෙන් ආයතනය විසින් කරනු ලබන ආයතනික දායකත්වය වන අතර, ඒ අනුව අරමුදලක් නොව, අනාගත බැඳීමක් වෙනුවෙන් සිදු කරනු ලබන වෙන්කිරීමක් පමණි. එම වෙන් කිරීම්වලට සාපේක්ෂව එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර ඇත. දැනට එම ආයෝජනයේ වටිනාකම රු.මි. 15.5 ක් පමණ වේ.<br><br>• මෙය රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් ආවරණය වන, ව්‍යවස්ථාපිත අරමුදල් යන්නට ගැනෙන අරමුදලක් නොවේ. | <u>ක්‍රියා කිරීම -</u><br>**1. අතිරේක ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>**2. සභාපති, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව**<br><br>මෙය සේවකයන් වෙනුවෙන්, ආයතනයේ අනාගත බැඳීමක් වෙනුවෙන් සිදු කරනු ලබන වෙන්කිරීමක් (Provision) ලෙසට හඳුනා ගන්නා ලදී |
| 4. ආයෝජන අරමුදල **(Investment Fund)**<br><br>ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව<br><br>මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, මෙම අරමුදල, රජයේ නොවන අරමුදලක් (Non Public Fund) ලෙසට හඳුනාගෙන ඇත.<br><br>• මෙය භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතු වල සිදු කරන ලද ආයෝජනය වන අතර ආයතනයේ අතිරික්ත මුදල් මෙසේ ආයෝජනය කර ඇත.<br><br>• මෙසේ රජයේ ආයතන විසින් අරමුදල් විවිධ මූලාශ්‍රවල ආයෝජනය කිරීමට වඩා ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවීමටත් අතිරික්ත අරමුදල් තිබේ නම් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | <u>ක්‍රියා කිරීම -</u><br>**1. අතිරේක ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**<br><br>**2. සභාපති, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව**<br>i.) මෙය රජයේ අරමුදලක් නොව ආයතනයේ අතිරික්ත මුදල් වලින් සිදු කරන ලද ආයෝජන ලෙසට හඳුනා ගන්නා ලදී.<br>ii.) මෙසේ රජයේ ආයතන විසින් අරමුදල් විවිධ මූලාශ්‍රවල ආයෝජනය කිරීමට වඩා ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා යෙදවීමටත් අතිරික්ත අරමුදල් තිබේ නම් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමටත් කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| **5.කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ චක්‍රීය අරමුදල (SMILE III - Revolving Fund)**<br><br>**6.පරිසර හිතකාමී චක්‍රීය අරමුදල II (E-Friend II Revolving Fund)**<br><br>• කර්මාන්ත හා ව්‍යවසාකත්ව සංවර්ධන අමාත්‍යාංශය, ජපන් ජාත්‍යන්තර සහයෝගිතා බැංකුව හා ශ්‍රී ලංකා රජය සමඟ 2004 වර්ෂයේ දී අත්සන් කරන ලද ගිවිසුම් ප්‍රකාරව 2005 වර්ෂයේ සිට ආරම්භ කර ඇත. 2010 වර්ෂයේ දී මුල් ව්‍යාපෘතිය අවසන් වී ඇති අතර, ගිවිසුම් ප්‍රකාරව මේ වන විට චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි. | • ආරම්භයේදී ජපන් සහයෝගිතා බැංකුව විසින් ලබා දුන් ණය මුදල් මත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක ව ඇත.<br><br>• එහිදී ව්‍යවසායකයන්ට ලබා ලබා දුන් ණයමුදල් වලින් කෙරෙන වාරික අයකිරීම් සහ පොළී මුදල් නැවත ණය ලබා දීම සඳහා යොදා ගැනීම මේ වනවිට සිදු වේ.<br><br>• මෙම ණය ක්‍රමය කුඩා හා සුළු පරිමාණ කර්මාන්තකරුවන් රාශියකට අඩු පොළී ණය අනුපාතය යටතේ ණය මුදල් ලබා දෙන බැවින් ඔවුන්ගේ ව්‍යවසායන් වැඩි දියුණු කර ගැනීම සඳහා රුකුලක් වී ඇති බවත්, ණය මුදල් නිකුත් කිරීමේදී, තීරණ ගැනීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක්ද, ණය මුදල් අනුමත කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක්ද, මඟින් සිදු කරනු ලබන බවත්, 2025.03.12 දින පැවති අරමුදල් සමාලෝචන කමිටුවේදී කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමිය විසින් පැහැදිලි කරන ලදි. එහිදී පහත කරුනු ද හෙළිදරව් විය.<br><br>• සියලුම ණය මුදල් නිකුත් කිරීම හා අයකිරීම බැංකු පද්ධතිය මඟින් සිදු කරනු ලබන බවත්, අමාත්‍යාංශය වෙත ණය මුදල් නිකුත් කිරීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබා දීමත්, ඒ අනුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අක්මුදල් නිදහස් කිරීමක් සිදු කරනු ලබන බවත්,<br><br>• මේ යටතේ බැංකු විසින් ණය ගැතියන්ගෙන් අයකර ගන්නා මුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නමින් පවත්වාගෙන යන ගිණුම වෙත එම බැංකු විසින් ප්‍රේෂණය කරනු ලබන බවත්, ද්‍රවශීල මුදල් ශේෂයක් අරමුදලේ නොපවතින බවත්.<br><br>• ණය මුදල් නිදහස් කිරීම සඳහා අවශ්‍ය මුදල් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නමින් ශ්‍රී ලංකා මහබැංකුවේ පවත්නා ගිණුම තුළින් නිදහස් කරනු ලබන බවත්,<br><br>• ජපන් සහයෝගිතා බැංකුව (JBIC) විසින් ලබා දී ඇති ණය මුදල භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ගෙවමින් සිටින බවත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත. | <u>ක්‍රියා කිරීම:</u><br>**1. ලේකම්,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br><br>• මෙය අරමුදලක් නොවන බවත්, පැවති ව්‍යාපෘතිය හරහා ලබා දුන් ණය අයකර ගැනීම සහ එකී අයකර ගත් ණය මුදල් භාවිතයෙන් කුඩා හා සුළු පරිමාණ ව්‍යවසායකයින් වෙත නැවත ණය ලබා දීම සඳහා ක්‍රියාත්මක ක්‍රියාවලියක් සහිත වැඩසටහනක් පමණකි. |

| | | |
|---|---|---|
| | • වාර්ෂිකව කර්මාන්ත අමාත්‍යාංශය විසින් ණය මුදල් ලබාදීම සඳහා නිර්දේශ කරනු ලබන ණය ප්‍රමාණයේ උපරිමය තීරණය කිරීම සඳහාත්, ලබා දෙන ණය මුදල් ප්‍රාග්ධන වියදමක් ලෙස වාර්තා කිරීම උදෙසාත්, වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුළින් මෙම අමාත්‍යාංශයට මෙම කාරණා සඳහා ප්‍රතිපාදන සලසා දෙන බව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පැහැදිලි කරන ලදි.<br>• මෙවැනි ආකාරයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය නිකුත් කිරීමේ වැඩසටහන් කිහිපයක් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව යටතේ සිදුවන බවත් මෙම වැඩසටහන ද ඒ හා සමාන වැඩසටහනක් බවත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරන ලදී.<br>• ඒ අනුව, මෙම ව්‍යාපෘතිය කුඩා හා සුළු පරිමාණ ව්‍යවසායකයින් වෙත ණය ලබා දීම සහ ණය අයකර ගැනීම යන කාර්යයන්ගෙන් යුත් ක්‍රියාවලියක් මිස යම් විශේෂ කාර්යයක් සඳහා නිර්මාණය කරන ලද හෝ පිහිටුවන ලද අරමුදලක් නොවන බව නිරීක්ෂණය වේ. | |

## 6.8 වෙනත් නිර්දේශ සහිත අරමුදල්

| අරමුදලේ නම, අරමුදල අයත් ආයතනය හා අරමුදල පිළිබඳව විස්තර කෙටියෙන් | කමිටුවේ නිරීක්ෂණ | කමිටුවේ නිර්දේශ සහ ක්‍රියා කළ යුතු නිලධාරියා |
|---|---|---|
| **1.ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල ණය අරමුදල ගිණුම (Sri Lanka Press Council Credit Fund)**<br>ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය<br>සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය<br>• 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පිහිටුවා ඇති අතර, 2009.08.12 | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, මෙම අරමුදල් රජයේ නොවන අරමුදල් (Non Public Funds) ලෙසට හඳුනා ගෙන ඇති අතර, ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් බවත් වාර්තා කර ඇත.<br>• සමාලෝචනය කළ දිනට (2016/2017) **Sri Lanka Press Council Credit Fund** හි ශුද්ධ වත්කම් ලෙස රු. 10,964,384.00 ක ශේෂයක් ද, **Sri Lanka Press Council Research Fund** හි ශුද්ධ වත්කම් ලෙස රු. 10,964,384.00 ක ශේෂයක් ද, හඳුනා ගෙන ඇත. | **ක්‍රියාකිරීම:**<br>**1.ලේකම්, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය**<br>**2. සභාපති, ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**<br>රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳව සමාලෝචනය කිරීමේ නිලධාරී කමිටුව විසින් 2025 පෙබරවාරි මසදී ලබාදුන් නිර්දේශ අනුව ශ්‍රී ලංකා පුවත්පත් |

| | | |
|---|---|---|
| දිනැති අංක 4 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් මෙම අරමුදල පිහිටුවා ඇත.<br><br>**2. ශ්‍රී ලංකා පුවත්පත් පර්යේෂණ අරමුදල් ගිණුම (Sri Lanka Press Council Research Fund)**<br>**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය**<br>**සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය**<br>• 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය පිහිටුවා ඇති අතර, 1993.10.22 දිනැති අංක 293 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් මෙම අරමුදල පිහිටුවා ඇත.<br>• දැනට මෙම අරමුදල් දෙක ඒකාබද්ධ කර ඇති අතර 2024.12.31 දිනට එහි ශේෂය රු.මි. 5.899 ක් වේ. | • 2009 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සේවක වැටුපෙන් අවකරණය කර ණය වාරික අත්තිකාරම් ගිණුමක තැන්පත් කර ගිණුමේ ශේෂය මත සේවකයින්ට ණය ලබා දීමේ අරමුණින් ‘ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල ණය අරමුදල ගිණුම’ පිහිටුවා ඇත.<br><br>• 1993 අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයතනයේ ග්‍රන්ථ ප්‍රකාශන විකිණීමෙන් ලද මුදල් තැන්පත් කිරීමේ අරමුණින් ‘ශ්‍රී ලංකා පුවත්පත් පර්යේෂණ අරමුදල් ගිණුම’ පිහිට වූ බවත්, පසුව පුහුණු පාඨමාලා මගින් ලද ආදායම් ද මෙම අරමුදලට බැරකිරීමක් කර ඇත.<br><br>• ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල ණය අරමුදල ගිණුම සහ ශ්‍රී ලංකා පුවත්පත් පර්යේෂණ අරමුදල් ගිණුම යන අරමුදල් දෙකම ඒකාබද්ධ කොට එක් අරමුදලක් නිර්මාණය කළ බව එම ආයතනයේ නිලධාරින් සඳහන් කළ බැවින් හා එය ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ලෙස නිරීක්ෂණය වන බැවින් ඒ සම්බන්ධයෙන් 2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 පරිදි කටයුතු කිරීම. | මණ්ඩලය වෙනුවට (හෝ මෙම ආයතනය පදනම වශයෙන් තබා ගනිමින්), වර්තමාන සංදර්භය තුළ ක්‍රියාත්මක වන බහුවිධ සන්නිවේදන මාධ්‍ය නියාමනයට හැකියාව සහිතව “ශ්‍රී ලංකා ජනමාධ්‍ය මණ්ඩලය” නමින් ආයතනයක් පිහිටුවීමට උපදෙස් දී ඇති බැවින්, ඒ පිළිබඳව ද අවධානය යොමු කොට 2024.11.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2024 පරිදි කටයුතු කිරීම. |
| **3. සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් සහ රුධිර පාරවිලන මධ්‍යස්ථානය යටතේ ඇති ව්‍යවස්ථාපිත නොවන අරමුදල් සංඛ්‍යාව 19 කි.** (ඇමුණුම 16) | • 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල් හා රුධිර පාරවිලන මධ්‍යස්ථානය යටතේ ඇති අරමුදල් 19 ක් (ඇමුණුම 16) රාජ්‍ය නොවන හා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් ලෙස වාර්තා කර තිබූ අතර ඒ පිළිබඳව 2025.05.14 දින මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී වැඩිදුර කරුණු සාකච්ඡා විය.<br>• වර්තමානය වන විටත් එම අරමුදල් ක්‍රියාත්මක තත්ත්වයේ පවතිද යන්න පිළිබඳවත් ඒවායේ ශේෂයන් පිළිබඳවත් කරුණු සොයා බැලීමත්, එවැනි කටයුතු විධිමත් කිරීමටත්, එම අරමුදල් අතර 2014 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අර්ථ නිරූපණය ප්‍රකාරව "රජයේ අරමුදල් " යන්නට ගැනෙන අරමුදල් සම්බන්ධයෙන් පනතේ සහ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | <u>ක්‍රියාකිරීම</u><br>**1. ලේකම්, සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය**<br><br>i) එම අරමුදල් වර්තමානය වන විටත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී නම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින් එකඟ වූ පරිදි ඒවායේ ශේෂ ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට බැර කර, එමගින් එම අරමුදල් අයත්ව තිබූ ආයතනවලට අවශ්‍ය සේවාවන් සැපයීමට කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| **4.**වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල<br><br>වැඩිහිටි ලේකම් කාර්යාලය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්‍ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි.3, 655.53 කි. | • පාර්ලිමේන්තුවේ නිසි අනුමැතියකින් තොරව වැඩිහිටි දීමනාවෙන් කොටසක් අයකර ගැනීමේ නීත්‍යානුකූල භාවය සම්බන්ධයෙන් ගැටලු සහගත බැවින් මෙම අරමුදල්වල අරමුණු සම්බන්ධයෙන් නැවත සමාලෝචනය කළ යුතු වීම.<br><br>• 2024.06.24 දිනැති සහ අංක 24 /1223/604/134 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි මෙම අයකර ගැනීම අත්හිටුවා ඇති බැවින් තවදුරටත් මෙම අරමුදලේ ලැබීම් මූලාශ්‍රයක් නොමැත. | <u>ක්‍රියා කිරීම</u><br>**1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යාංශය**<br><br>වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදල, වැඩිහිටියන්ගේ සුභසාධනය සඳහා වන අරමුදල වෙත මාරු කිරීමට අංක 25/0922/820/014 හා 2025.05.15 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්ව ඇති හෙයින් එහි තීරණය පරිදි ඉදිරි කටයුතු සිදු කිරීම. |
| **5. Gem Rewards Fund**<br><br>ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය<br><br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br><br>• 2024.12.31 දිනට අරමුදලේ ශේෂය රු. මි. 70කි. | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව;<br><br>• මෙවැනි අරමුදලක් ස්ථාපනය සඳහා 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනතේ විධි විධාන නොමැති වුවද, එම පනතේ 14 (2) වගන්තිය ප්‍රකාරව වැටලීම් මගින් ලැබෙන දඩ මුදලින්, ප්‍රතිලාභ ගෙවීමට ඇති හැකියාව මත මෙම අරමුදල ගොඩනගා ඇත.<br>• මේ විට මෙම අරමුදලේ අවශ්‍යතාවය ඉක්මවා ගිය ශේෂයක් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වේ.<br>2025.03.06 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී විෂය භාර අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහ අදාල ආයතනයේ නිලධාරීන්ගේ පැහැදිලි කිරීම<br>• මෙම අරමුදල 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනතේ විධි විධාන ප්‍රකාරව ස්ථාපනය කර ඇති බවත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත නීති විරෝධී කටයුතු වැටලීම් මගින් ලැබෙන දඩ මුදලින් 50 % ක් මෙම අරමුදලට බැර කරන බවත්, එම වැටලීම | <u>ක්‍රියා කිරීම</u><br>**1. ලේකම්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**<br><br>**2. සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**<br><br>i) ඉදිරිපත් වූ තොරතුරු අනුව මේ සඳහා වෙනමම අරමුදල් පවත්වාගෙන යාමකින් තොරව මෙම ගණුදෙනු ද ආයතනයේ සාමාන්‍ය කටයුතු ලෙස සිදු කිරීමට ඇති හැකියාව පරීක්ෂා කර බලා, ඒ අනුව කටයුතු කිරීම.<br><br>ii).1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනතේ |

| | | |
|---|---|---|
| | හා සම්බන්ධ නිලධාරීන්ට මෙම අරමුදලින් ප්‍රතිලාභ ලබා දෙන බවත් මෙම අරමුදලේ කටයුතු වෙනමම බැංකු ගිණුමක් යටතේ සිදුකරන බවත් ප්‍රකාශ කරන ලදි.<br><br>2025.03.06 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී භාණ්ඩාගාරයේ නිලධාරීන්ගේ පැහැදිලි කිරීම.<br><br>• ඉදිරිපත් වූ තොරතුරු අනුව මෙම අරමුදල සඳහා වෙනම ගිණුම් ප්‍රකාශ පිලියෙල නොකරන බවත්, ලෙජර් ගිණුමක් ලෙස මෙම ගණුදෙනු සටහන් කර ශේෂය ඉදිරියට ගෙන යන බවත්, සඳහන් කළ ද මෙම ගිණුමේ ශේෂය ඉදිරියට ගෙන යන බැවිනුත් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39(4) වන වගන්ති ප්‍රකාරව රජයේ ආයතනයකට පවත්වාගෙන යා හැක්කේ ව්‍යවස්ථාපිත අරමුදල් පමණක් වන බවත් එබැවින් මෙම අරමුදල, ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදලක් ද යන්න හඳුනාගැනීම අවශ්‍ය වන අතර ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් ලෙස එහිදී හඳුනාගන්නේ නම් ඒ සම්බන්ධයෙන්ද 4/2024 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කළ යුතු වේ. | විධිවිධාන ප්‍රකාරව මෙම කාර්යයන් සිදු කරන ලෙස සඳහන් වුවද වෙනමම අරමුදලක් පවත්වාගෙන යාමට එකී පනතේ ප්‍රතිපාදන සලසා තිබේද යන්න පිළිබඳ හා අරමුදලේ ලැබීම් මූලාශ්‍ර පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම. |
| **6. Gem Mining Welfare Fund**<br><br>**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය**<br><br>**කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**<br><br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 40.74 කි. | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව<br><br>• මෙවැනි අරමුදලක් ස්ථාපනය සඳහා 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනතේ විධි විධාන නොමැති වුවද එම පනතේ 14(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන්ගේ ආරක්ෂාව සඳහා අවශ්‍ය විධිවිධානය සැලසිය යුතු බවට වන ප්‍රතිපාදන සැලසී ඇත. මෙය අභ්‍යන්තර අරමුදලක් ලෙස ක්‍රියාත්මක වන අතර, අවශ්‍යතාවයට වඩා වැඩි අරමුදල් ශේෂයක් පවත්වාගෙන යනු ලබයි. අරමුදලේ ලැබීම් මූලාශ්‍ර පිළිබඳව නිශ්චිතව සඳහන් නොවේ.<br><br>2025.03.06 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී විෂය භාර අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහ අදාල ආයතනයේ නිලධාරීන්ගේ පැහැදිලි කිරීම | <u>ක්‍රියා කිරීම</u><br>**1) ලේකම්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**<br><br>**2)සභාපති, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය**<br><br>i) ඉදිරිපත් වූ තොරතුරු අනුව මේ සඳහා වෙනමම අරමුදල් පවත්වාගෙන යාමකින් තොරව මෙම ගණුදෙනු ආයතනයේ සමාන්‍ය කටයුතු ලෙස සිදු කිරීමට ඇති හැකියාව පරීක්ෂා කර බලා ඒ අනුව කටයුතු කිරීම. |

| | | |
|---|---|---|
| | • මැණික් පතල්වල කාර්යයේ නියුතු පුද්ගලයන් ජීවිතවල ඇති අවධානම හේතුකොට ගෙන එම පුද්ගලයන්ගේ රැකවරණ කටයුතු සඳහා මෙම අරමුදල පිහිටුවා ඇත. පතල් කැනීම් බලපත්‍ර ගාස්තුවෙන් රු. 500 ක මුදලක් මෙම අරමුදලට බැර වේ.<br>2025.03.06 දින මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේදී භාණ්ඩාගාරයේ නිලධාරීන්ගේ පැහැදිලි කිරීම.<br>• මෙම අරමුදලේ කටයුතු සඳහා වෙනමම බැංකු ගිණුමක් පවත්වාගෙන නොයන බැවින්, ඒ අනුව වෙනම මූල්‍ය ප්‍රකාශ පිලියෙල නොකරන බවත් ඉදිරිපත් වූ තොරතුරු අනුව පැහැදිලි වුවද මෙහි ක්‍රියාකාරිත්ව, ව්‍යවස්ථාපිත / ව්‍යවස්ථාපිත නොවන බව හා අරමුදලේ ශේෂය හා සේවාදායකයන්ගේ සුභසාධන කටයුතු වෙනුවෙන් වෙන් කර ගන්නා ගාස්තුවලින් සිදුවන සේවාවේ ප්‍රමාණවත් බව හා තත්ත්වය පිළිබඳව අමාත්‍යාංශ විසින් අධ්‍යනය කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කල යුතු බව දැනුවත් කිරීම.<br>• එසේම, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 39(4) වන වගන්ති ප්‍රකාරව රජයේ ආයතනයකට පවත්වාගෙන යා හැක්කේ ව්‍යවස්ථාපිත අරමුදල් පමණක් වන බවත් එබැවින් මෙම අරමුදල, ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත ප්‍රකාරව ව්‍යවස්ථාපිත අරමුදලක් ද යන්න හඳුනාගැනීම අවශ්‍ය වන අතර ව්‍යවස්ථාපිත නොවන නොවන අරමුදලක් ලෙස එහිදී හඳුනාගන්නේ නම් ඒ සම්බන්ධයෙන්ද 04/2024 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කළ යුතු වේ. | ii)1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනතේ විධි විධාන ප්‍රකාරව මෙම කාර්යයන් සිදු කරන ලෙස සඳහන් වුවද වෙනමම අරමුදලක් පවත්වාගෙන යාමට එකී පනතේ ප්‍රතිපාදන සලසා තිබේද යන්න පිළිබඳ හා අරමුදලේ ලැබීම් මූලාශ්‍ර පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම. |
| **7. Jewelry Development Fund**<br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය<br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br>• 2024.12.31 දිනට මෙම අරමුදලේ ශේෂය රු.මි. 101.45 කි. | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව<br>• 1993 අංක 50 දරන මැණික් හා ස්වර්ණාභරණ පනතට අනුව මෙම අරමුදලේ අරමුණ වනුයේ ස්වර්ණාභරණ කර්මාන්තයේ තාක්ෂණික සංවර්ධනයන් සඳහා උපකාර කිරීමයි. අරමුදලේ ලැබීම් සහ ගෙවීම් පරීක්ෂා කිරීමේ දී මෙම කර්මාන්තයේ සංවර්ධනය සඳහා ආයතනය සතුව ප්‍රමාණවත් සැලසුමක් නොමැති බව | <u>ක්‍රියා කිරීම</u><br>**1.)** ලේකම්, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br>**2.)** සභාපති, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය<br>i.) ඉදිරිපත් වූ තොරතුරු අනුව මේ සඳහා වෙනමම |

| | | |
|---|---|---|
| | නිරීක්ෂණය වෙයි. එසේම මෙම අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් හෝ භාර අරමුදලක් ලෙස නිරීක්ෂණය නොවේ. | අරමුදල් පවත්වාගෙන යාමකින් තොරව මෙම ගණුදෙනු ද ආයතනයේ සමාන්‍ය කටයුතු ලෙස සිදු කිරීමට ඇති හැකියාව පරීක්ෂා කර බලා ඒ අනුව කටයුතු කිරීම.<br><br>ii.)1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනතේ ප්‍රකාර වෙනමම අරමුදලක් පවත්වාගෙන යාමට එකී පනතේ ප්‍රතිපාදන සලසා තිබේද යන්න පිළිබඳ හා අරමුදලේ ලැබීම් මූලාශ්‍ර පිළිබඳ තවදුරටත් අධ්‍යයනය කර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම. |
| **08.** වෛද්‍යාධාර යෝජනා ක්‍රමය<br><br>**පොල් වගා කිරීමේ මණ්ඩලය**<br><br>**වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**<br><br>මෙම අරමුදල අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පරිදි ස්ථාපිත කර ඇත. 2010 වර්ෂයේ ජූලි මාසයේ සිට මේ දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වේ. | 2017.03.31 දිනැතිව නිකුත් කරන ලද රජයේ අරමුදල් සමාලෝචනය පිළිබඳ කමිටු වාර්තාව අනුව කමිටුව විසින් මෙම අරමුදල සමාලෝචනය කර නොමැත.<br><br>• රාජකාරි කාලය තුළ සිදුවන රෝගාබාධ, අනතුරු සහ මරණ සම්බන්ධ වියදම් සඳහා සේවකයින්ට සහාය වීම සඳහා මෙම යෝජනා ක්‍රමය ස්ථාපිත කර ඇත. පොල් වගා කිරීමේ මණ්ඩලයේ ස්වයං මූල්‍ය ඒකකයේ දායකත්වය හා සේවක වැටුප් දායක මුදල් මෙම අරමුදලේ ලැබීම් මූලාශ්‍ර වේ.<br><br>• සේවකයින්ට වෙනත් වෛද්‍ය ආධාර යෝජනා ක්‍රම සඳහා ප්‍රවේශය නොමැති බැවින්, අරමුදල පවත්වාගෙන යන බව වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ නිලධාරීන් රැස්වීම්වලදී ප්‍රකාශ කොට ඇත.<br><br>• මෙම යෝජනා ක්‍රමය සඳහා රු. මි. 6.77 ක මූලික ආයෝජනයක් අවශ්‍ය වී ඇති අතර, කාර්ය මණ්ඩල දායකත්වයෙන් රු. මි. 1.35 ක් සහ පොල් වගා කිරීමේ මණ්ඩලයෙ අරමුදල්වලින් රු. මි. 5.42 ක් ලබා ගැනීමට කටයුතු කර ඇත. | <u>ක්‍රියාකිරීම</u><br><br>**1. ලේකම්, වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**<br><br>**2. සභාපති, පොල් වගා කිරීමේ මණ්ඩලය**<br>**3. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**<br><br>(i) මෙවැනි රාජ්‍ය ව්‍යවසායන් තුළ ක්‍රියාත්මක වෛද්‍යාධාර යෝජනා ක්‍රම ඇතුළු සුභසාධන අරමුදල් සඳහා සේවකයින්ගෙන් ලබාදෙන දායකත්වයට අමතරව රාජ්‍ය ව්‍යවසායන්හි දායකත්වය ලබාදෙන බව අවස්ථා කිහිපයකදී නිරීක්ෂණය වූ |

| | | |
|---|---|---|
| | • 2022 වසරේ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීමේදී, මෙම අරමුදල රජයේ විගණකාධිපති නොව පෞද්ගලික ආයතනයක් විගණන කටයුතු සිදුකර ඇති බවත්, මේ අරමුදලේ ආදායම් ලෙස ස්ථාවර තැන්පතු පොලිය පමණක් පිළිබිඹු වන අතර, වර්ෂයේ ශුද්ධ ආදායමෙන් 75% ක් සේවකයින් අතර බෙදා හැර ඇති බවත් නිරීක්ෂණය වේ.<br>• වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලයේ ස්වයං මූල්‍ය ඒකකයෙන් දායකත්වයක් ලැබෙන බැවින්, මෙය සුභසාධන අරමුදලක් නොවේ. මෙම අරමුදල රජයේ නොවන අරමුදලක් ලෙස පවත්වාගෙන යාමට අදහස් කරන්නේ නම්, මණ්ඩලයේ සේකවයින්ගේ වැටුප් දායකත්වයක් පමණක් ලබාගත යුතුව ඇත. කෙසේ වුවද, 1971 අංක 46 දරන පොල් සංවර්ධන අධිකාරි පනත මඟින් මණ්ඩලයේ සේවයේ නියුතු පුද්ගලයින් සඳහා මූල්‍ය සහන සහ සුභසාධන අවශ්‍යතා සැපයීම සඳහා අවශ්‍ය බලතල මණ්ඩලය වෙත ලබා දී ඇත.<br>• මෙය අරමුදලක් ලෙස නොව ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් යටතේ ක්‍රියාත්මක කිරීමට හැකිවන අතර, එහෙත් මෙවැනි යෝජනා ක්‍රම සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කිරීමත් ඒ සඳහා ප්‍රතිපත්තිමය තිරණයක් ගැනීමත් කළ යුතු වේ. | බැවින්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් මෙවැනි අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳව පොදු ප්‍රතිපත්තියක් සකස් කිරීම.<br><br>(ii) එතෙක් නිසි ක්‍රමවේද අනුගමනය කරමින් සහ නිසි අනුමැතින්ට යටත්ව වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය කිරීමේ කටයුතු මණ්ඩලයේ වාර්ෂික අයවැය හරහා සිදු කිරීම. |

## 7. පොදු නිරීක්ෂණ හා නිර්දේශ

### 7.1 පොදු නිරීක්ෂණ

- රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන අරමුදල්වල කටයුතු පිළිබඳව සමාලෝචනයේදී එම ආයතන යටතේ පවත්වාගෙන යනු ලබන සුභසාධක අරමුදල් ඇතුළු ඒ හා සමාන අරමුදල් රජයේ ගොඩනැගිලි සහ කාර්ය මණ්ඩලය වැනි රජයේ භෞතික සහ මානව සම්පත් භාවිතා කරමින් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වේ.
- එසේම, විධිමත් අනුමැතියක් ලබා ගැනීමකින් තොරව, රජයේ අරමුදල් භාවිතා කරමින් රජය සතු ව්‍යාපාර (SOEs) විසින් උප අරමුදල් නිර්මාණය කරමින්, එම අරමුදල් හරහා රක්ෂණ ක්‍රම, සහන ණය යෝජනා ක්‍රම, වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම වැනි වැඩසටහන් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වේ.
- රජයේ සමහර ආයතන රාජ්‍ය සම්පත් සහ රජයේ නිලධාරීන් යොදා ගනිමින් වාණිජමය ස්වරූපයේ අරමුදල්/ ආයතනය ස්ථාපනය කොට පවත්වාගෙන යනු ලබන බවත්, ඒවායේ ඉපැයීම් හෝ ඉන් යම් සාධාරණ ප්‍රතිශතයක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු නොකරන බවත් නිරීක්ෂණය වේ.
- රජයේ සම්පත් සහ රජයේ කාර්ය මණ්ඩලය යොදවා ගනිමින් අරමුදල් සඳහා වත්කම් ගොඩනැගීම සහ අත්පත් කර ගැනීම සිදු වුවද ඒවා ජාතික ගිණුම් තුළට ඇතුළත් නොවන අවස්ථා ඇති වීමට ඉඩකඩ ඇති බව නිරීක්ෂණය වේ .
- බොහෝ අරමුදල් අපේක්ෂිත අරමුණ ඉටුකිරීම සඳහා කටයුතු කරනවාට වඩා අරමුදලේ ශේෂය ඉහළ නංවා ගැනීමට කටයුතු කිරීමත් අතිරික්ත ශේෂ විවිධ මූලාශ්‍රවල ආයෝජනය කිරීමට කටයුතු කිරීමත් සිදු කරන බව පොදුවේ නිරීක්ෂණය වේ.
- රජයේ ආයතන විසින් සපයනු ලබන සේවාවන් වෙනුවෙන් මහජනතාවගෙන් අය කරනු ලබන ගාස්තු බොහොමයක් විවිධ අරමුදල්වලට බැර වන බව නිරීක්ෂණය වන අතර එසේ බැර කරනු ලබන අරමුදල් භාවිත කරමින් විවිධ වියදම් දැරීමත්, වත්කම් අත්පත් කර ගැනීමත් සිදු කිරීම තුළින් රාජ්‍ය ආයතන විසින් එකතු කරනු ලබන සමස්ත ආදායමත්, දරනු ලබන සමස්ත වියදමත්, අත්පත් කර ගනු ලබන වත්කම් සම්බන්ධයෙනුත් තොරතුරු ජාතික ගිණුම්වලට ඇතුළත් නොවන බව නිරීක්ෂණය වේ.

### 7.2 නිර්දේශ

- මෙම කමිටු වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කොට එහි අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම.
- රාජ්‍ය ව්‍යවසායන්වල සේවකයන්ගේ සුභසාධන කටයුතු සම්බන්ධයෙන් පවත්වාගෙන යන අරමුදල් සඳහා පොදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම පිළිබඳව හා ඒකාබද්ධ අරමුදලට බැර විය යුතු ආදායම් එම අරමුදල්වලට බැර කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කිරීම හා අදාළ මාර්ගෝපදේශ සැපයීම සුදුසු වේ.
